# 2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත

# ගොවි සංවිධාන අතුරු ව්‍යවස්ථාව

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.

# ගොවි සංවිධාන අතුරු ව්‍යවස්ථාව

.................. පළාතේ ......................... දිස්ත්‍රික්කයේ.................................ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ................................. ගොවිජන සේවා බල ප්‍රදේශයේ ................................ ග්‍රාම නිලධාරි/කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර කොට්ඨාශයේ ................................... සංවිධානයේ අතුරු ව්‍යවස්ථාව.

(ගොවි සංවිධානයේ නම)

ලියාපදිංචි අංකය .........................................
ලියාපදිංචි කළ දිනය .......................................

02. නාමය

ගොවි සංවිධානයේ නාමය ..............................................................................................................
.................................................................... වන්නේය.

02. ලිපිනය

සංවිධානයේ ලිපිනය ..........................................................................................................................

..................................................................................................................................... වේ.

03. බල ප්‍රදේශය

ගොවි සංවිධානයේ බල ප්‍රදේශය ........................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................
..................................................................................................................................... වන්නේය.

04. පරමාර්ථයන් -

කෘෂිකාර්මික කටයුතු වල නියැලෙන ජනතාවගේ හා ඔවුන්ගේ පවුල් වල ආදායම් තත්වය, සාමාජයීය තත්වය, පෝෂණ තත්ත්වය, සෞඛ්‍ය තත්ත්වය, අධ්‍යාපන හා අධ්‍යාත්මික තත්ත්වය වර්ධනය කර ගැනීම, කෘෂිකාර්මික ඉඩම් වල කාර්යක්ෂමතාවය ඉහළ දැමීමට කටයුතු කිරීම උදෙසා,

I. අන්‍යෝන්‍ය සහයෝගය සහ කැපවීම තුළින් සාමාජිකයන්ගේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා කණ්ඩායම් ගතවීම.
II. කෘෂිකාර්මික කටයුතු වලට අවශ්‍ය යෙදවුම් හා මූල්‍ය පහසුකම් සපයා ගැනීම.
III. නිෂ්පාදන සඳහා අලෙවි පහසුකම් සැපයිම සහ නිෂ්පාදන අගය වැඩි කිරීම සඳහා සුදුසු වැඩපිළිවෙල සැකසීම
IV. කෘෂිකාර්මික කටයුතු සඳහා වන නවීන තාක්ෂණය භාවිතයට ගැනීම
V. කෘෂිකාර්මික ඉඩම්, රජයේ කෘෂිකාර්මික ප්‍රතිපත්ති වලට අනුකූලව වගා කරවීමට පෙළඹවීම.

VI. ........................................................................................................................................

**05.** බලතල

**සංවිධානයේ පරමාර්ථ ඉටුකර ගැනිම සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව අනුව පහත සඳහන් බලතල සංවිධානයට තිබේ.**

(අ) ගොවි සංවිධානයේ නාමයෙන්, එය විසින් නඩු පැවරීමට හා එයට විරුද්ධව නඩු පැවරීම කළ හැකිය.
(ආ) ගොවි සංවිධාන බල ප්‍රදේශය ඇතුළත හෝ එහි සාමාජිකයන්ගේ කෘෂිකාර්මික ඉඩම් වල, ඉඩම් හිමි ගොවින්ගේ සහ භුක්තිකරුවන්ගේ රැස්වීම් කැඳවනු ලැබිය හැකිය.
(ඇ) නියමිත බැංකු හෝ රාජ්‍ය ආයතන වලින් ණය හෝ අත්තිකාරම් ලබා ගැනීමට හැකිය.
(ඈ) නියමිත කාලපරිච්ඡේදයන් තුළ ණය ආපසු අය කර ගැනීමේ හා ආපසු ගෙවීමේ පදනම මත හවුල් ණයයෝජනා ක්‍රම යටතේ තම සාමාජිකයන් සඳහා නියමිත බැංකු වලින් හෝ ණය ආයතන වලින් ණය ලබා ගත හැකිය.
(ඉ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනිම, දැරීම, බද්දට ගැනීම හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම හෝ ඕඩපනය කිරීම සිදු කළ හැකි වීම.
(ඊ) ගොවි සංවිධානයක මුදල් එහි කාර්යය කිරීමෙහිලා ප්‍රයෝජනයට ගැනීම කළ හැකි වීම.
(උ) ස්වකීය සාමාජිකයන් වෙත ණය දීම සඳහා ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී මුදල් ප්‍රයෝජනයට ගනු ලැබිය හැකිය.
(ඌ) අනු කමිටු පිහිටුවීම සහ අරමුණු කරනු ලබන කාර්යයන් ක්‍රියාත්මක කිරීම කළ යුතුය.
(එ) තම සාමාජිකයන්ගේ තැන්පතු ලබා ගෙන සාමාජිකයන් වෙත ණය දීම සඳහා එම තැන්පතු ප්‍රයෝජනයට ගත යුතුය.

(ඒ) සාමාජිකයන්ගේ පොදු ආර්ථික, සාමාජයීය අවශ්‍යතා සපුරාලීම සඳහා නීත්‍යානුකූල වූ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යා හැකිය.

(ඔ) ඉහත කී ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය අරමුදල් සාමාජික හා සාමාජික නොවන අයගෙන් ලබා ගත හැකිය.

(ඕ) වාරිකර්මාන්ත ආරක්ෂාව, අධීක්ෂණය, නඩත්තුව, වාරිමාර්ග ජලය කළමනාකරණය හා වාරිමාර්ග නඩත්තු අරමුදලක් පිහිටුවීම හා පවත්වාගෙන යාම සිදුකළ යුතුය.

(ඖ) ගොවි සංවිධාන බල ප්‍රදේශය තුළ වාරි ව්‍යාපෘතියක් හෝ යම් සංවර්ධන ව්‍යාපෘතියක් ආරම්භ කරනු ලබන අවස්ථාවක යෝජිත ඉදිකිරීම් හෝ ව්‍යාපෘතිය ආරම්භ කරනු ලබන අවස්ථාවේ දී ඒ පිළිබඳව විමසා බැලීම හා අදහස් ලබා දීම සිදු කළ යුතුය.

(ක) කුඹුරු ඉඩම් වලට හා ජල මාර්ග වලට අපද්‍රව්‍ය දැමීම සිදුකරන අවස්ථාවල, වාරිකර්මාන්ත ආරක්ෂා කිරීමට බාධා පමුණුවන අවස්ථාවල එය වළක්වා ගැනීමට කටයුතු කිරීම හා කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දීම සිදු කළ යුතු වීම.

(ග) තම බල ප්‍රදේශය තුළ ඉඩම්හිමි ගොවීන් හා භුක්තිකරුවන්ගේ රැස්වීම් පවත්වා කෘෂිකාර්මික කටයුතු සංවර්ධනය කිරීමට අදාළ තීරණ ගැනීම හා රීති සකස් කිරීමේ කාර්යය සිදු කිරීම.

(ජ) කෘෂි ක්ෂේත්‍රයේ චාරිත්‍ර වාරිත්‍ර වලට හෝ රීති වලට පටහැනිව සිදු කරන ක්‍රියා සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම, ඒ සඳහා වියදම් දැරීම හා එම වියදම් ආපසු අයකර ගැනීමට කටයුතු කිරීම.

(ට) පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී කොමසාරිස්ජනරාල්වරයා විසින් නිර්දේශ ඉල්ලා සිටින අවස්ථාවල නිර්දේශ ලබා දීම.

**(ඩ) සංවිධානයේ පරමාර්ථ සපුරාලීමට අවශ්‍ය වන හෝ ආධාර වන වෙනත් යම් කාර්යයන් සහ ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහිලා, ගොවිජන සංවර්ධන පනතට හා පනත යටතේ සකස් කර ඇති නියෝග, රෙගුලාසි, චක්‍රලේඛ, උපදෙස් පත්‍රිකා අනුව සහ මෙම අතුරු ව්‍යවස්ථාවට අනුකූලව අවශ්‍ය කටයුතු කිරීම.**

06. කාර්යයන්

අතුරු ව්‍යවස්ථානුකූලව පහත සඳහන් කාර්යයන් කිරීමට ගොවි සංවිධානයට බලය තිබේ.

(1) ප්‍රදේශය සඳහා වාර්ෂික කෘෂිකාර්මික සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීම.

(2) බල ප්‍රදේශයේ සතුටුදායක ලෙස වගා කරනු නොලබන කෘෂිකාර්මික ඉඩම් පිළිබඳ තොරතුරු රැස් කිරීම.

(3) ගොවි සංවිධාන බල ප්‍රදේශයේ කෘෂිකාර්මික ඉඩම්, කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ සහ කාෂිකාර්මික සත්ත් වයින් පිළිබඳ දත්ත එකතු කිරීම හා සැපයීම.

(4) බල ප්‍රදේශයේ පාංශු සංරක්ෂණය, කාර්යක්ෂම ජල පරිහරණය, කාබනික පොහොර භාවිතය ධෛර්යමත් කිරීම, නිර්දේශිත කෘෂිකාර්මික භෝග වගා කිරීම, සතුන් වර්ග බෝ කිරීම හෝ මිරිදිය මත්ස්‍ය වගා කිරීම.

(5) එම භෝග හා සතුන්, මිරිදිය මත්ස්‍යයන් රෝග වලින් හා ව්‍යසන වලින් මිදී ඇති බවට වග බලා ගැනීම සඳහා පියවර ගැනීම

(6) ස්වකීය බල ප්‍රදේශයේ ගොවීන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පරිසරහිතකාමී ක්‍රම යොදා ගැනීම සඳහා ඔවුන් ධෛර්යමත් කිරීම.

ඉහත අංක 01 සිට අංක 06 දක්වා කාර්යයන් ඉටු කිරීම මගින් ගොවිජන සංවර්ධන සභාවට සහාය වීම.

(7) කෘෂිකාර්මික ඉඩම් වල ඉඩම් හිමි ගොවීන්ගේ හා භුක්තිකරුවන්ගේ තොරතුරු ගොවිජන සංවර්ධන සභාවට ඉදිරිපත් කිරීම.

(8) කෘෂිකර්මයට අදාළ භාණ්ඩ හා සේවා සැපයීම.

(9) ගොවිසංවිධාන අරමුදල් නියමිත බැංකුවක ගිණුම් වල තැන්පත් කිරීම, ගොවි සංවිධානයේ උන්නතිය සඳහා ප්‍රයෝජනයට ගැනීම.

(10) කෘෂිකර්ම ක්ෂේත්‍රයේ රාජ්‍ය හා පෞද්ගලික ආයතන සහ ප්‍රදේශයේ ගොවීන් සමඟ අන්‍යෝන්‍ය සහයෝගයෙන් කටයුතු කිරීම.

(11) උපකරණ හා යන්ත්‍ර සූත්‍ර ආදිය පහසු මිලට ලබා ගැනීම සහ සාමාජිකයන් අතර බෙදාහැරීම හෝ සාමාජිකයන් සඳහා ඒවා පරිහරණයට යෙදවීම.

7. සාමාජිකත්වය -

මෙම අතුරු ව්‍යවස්ථාවට අනුකූලව සංවිධානයේ සාමාජිකත්වය පහත සඳහන් පුද්ගලයන්ගෙන් සමන්විත වේ.

අ) ගොවි සංවිධාන බල ප්‍රදේශයේ කෘෂිකාර්මික කටයුතුවල නියැලී සිටින එසේම මෙම ව්‍යවස්ථාවේ අංක 08 යටතේ සුදුසුකම් ලබා ඇති අයෙකුට ගොවි සංවිධානයේ සාමාජිකත්වය ලබා ගත හැකි වේ.

(ආ) ගොවි සංවිධාන අතුරු ව්‍යවස්ථාවට අනුකූලව නිසි පරිදි සාමාජිකයෙක් ලෙස ඇතුලත් කරගත් සෑම පුද්ගලයකු ද වේ.

(08). සාමාජිකත්වයට සුදුසුකම්

- කෘෂිකර්මය තම ජීවිකාව කරගත් සෑම තැනැත්තකුම තමා -

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු නම්:
(ආ) වයස අවුරුදු දහසයට නොඅඩු නම් : සහ
(ඇ) තමා සාමාජිකත්වය අපේක්ෂා කරන ගොවි සංවිධාන බල ප්‍රදේශයේ පදිංචි වී ඇත්නම් හෝ අවුරුදු දෙකකට වැඩි කාල පරිච්ඡේදයක් සඳහා ඒ බල ප්‍රදේශයේ කෘෂිකාර්මික කටයුතු වල නිරතව සිටියේ නම්, ගොවි සංවිධානයේ සාමාජිකත්වය සඳහා සුදුස්සකු විය යුතුය.

- ගොවි සංවිධානයේ ආශ්‍රිත සාමාජිකත්වය -

(අ) තම ප්‍රධාන ජිවිකාව කෘෂිකර්මය නොවන්නා වූ ද ගොවි සංවිධාන බල ප්‍රදේශය ඇතුලත කෘෂිකාර්මික ඉඩමක අයිතිකරු හෝ පදිංචිකරු: නැතහොත්
(ආ) කෘෂිකර්මයට අදාළ යම් නිෂ්පාදනයක හෝ කෘෂිකාර්මික නිෂ්පාදන හෝ භාණ්ඩ අලෙවියෙහි නිරත වූ යම් තැනැත්තකු ගොවි සංවිධානයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා ගැනීමට සුදුස්සකු විය යුතුය.

(09). සාමාජිකත්වයට ඇතුලත් කර ගැනීම -

1) සාමාජිකත්වය ලැබීමට සංවිධානයේ ලේකම් වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරන ඉහත සුදුසුකම් ඇති ඕනෑම පුද්ගලයෙකු සාමාජිකයෙකු වශයෙන් බඳවාගනු ලැබේ.
2) සෑම ඉල්ලුම් පත්‍රයක්ම සංවිධානය විසින් පිළියෙල කරන ලද ආකෘති පත්‍රයක් අනුව වියයුතු වේ. ඉල්ලුම්කරන සාමාජිකයා විසින් සිදු කරනු ලබන කෘෂිකාර්මික කටයුතු ආදිය ගැන ඉල්ලුම් පත්‍රයේ කෙටියෙන් සඳහන් කළ යුතු අතර සෑම ඉල්ලුම් පත්‍රයක්ම ඉල්ලුම්කරු විසින්ම අත්සන් කළ යුතුය.
3) සාමාජිකත්වය වෙනුවෙන් ගෙවිය යුතු ඇතුළත්වීමේ ගාස්තුව වන රුපියල් ........................ක මුදලක් ඉල්ලුම් පත්‍රය සමඟ සමිතියේ භාණ්ඩාගාරික වෙත ගෙවිය යුතුවේ.

4) සාමාජිකත්වය අපේක්ෂා කරන සෑම ඉල්ලුම්කරුවෙකුගේම නම, ඊළග කාරක සභා රැස්වීමට ඉදිරිපත් කළ යුතුය. සාමාජිකත්වය ලබා දීමට සුදුසුකම් ඇති ඉල්ලුම් පත් පිළිගැනීමටත් සුදුසුකම් නැති ඕනෑම ඉල්ලුම් පත්‍රයක් ප්‍රතික්ෂේප කිරීමටත් නිර්දේශ ඉදිරිපත් කිරීමට කාරක සභාවට හැකි අතර එම නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතුය.

**10. සාමාජිකයිගේ නාමලේඛණය**

ගොවි සංවිධානය විසින් සාමාජික නාමලේඛනයක් පවත්වාගෙන යා යුතු වන්නේය. එම ලේඛනයෙහි සාමාජිකයාගේ නම, ලිපිනය, වයස, ඔහුට අයත් කෘෂිකාර්මික ඉඩම්, අනෙකුත් වත්කම් පිළිබඳ විස්තර, ආදායම් මාර්ග, සාමාජිකයෙකු ලෙස ඇතුළත් වූ දිනය, සාමාජිකයා විසින් ඔහුගේ නියෝජිතයෙකු ලෙස නම් කරන ලද තැනැත්තන් වෙතොත් ඔවුන්ගේ නම්, සාමාජිකයාගේ අත්සන හෝ වම් මාපට ඇඟිලි සලකුණ හා සංවිධානය මඟින් අපේක්ෂිත අනෙකුත් විස්තර ද ඇතුළත් විය යුතුය.

(11.) **සාමාජිකයන්ගේ අයිතිවාසිකම් සහ යුතුකම්**

(අ) මෙම අතුරු ව්‍යවස්ථාවේ අංක 08 යටතේ ඇතුළත් කර ගන්නා සාමාජිකයන්ට මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් සියලුම අයිතිවාසිකම්, යුතුකම් හා වගකීම් පැවරී ඇත.
(ආ) සෑම සාමාජිකයෙකුම සංවිධානයේ කාරක නියෝගවල අඩංගු කොන්දේසි පිළිපැදිමට එකඟ විය යුතුය.

(12) **හිමිකම් පැවරීම**

සෑම සාමාජිකයෙකු විසින්ම තමාගේ මරණයෙන් පසු තමාගේ කොටස් හා තම සාමාජිකත්වයේ හිමිකම් පැවරීම සඳහා එක් අයකු හෝ ඊට වැඩි දෙනෙක් නම් කළ යුතු වන්නේය. එක් අයෙකුට වඩා නම් කරන විට තමාගේ කොටස් හා වෙනත් හිමිකම් ඒ නම් කරන ලද කීප දෙනා අතර කුමන ආකාරයකින් බෙදා හැරිය යුතු දැයි සඳහන් කළ යුතු වේ. තමා නම් කරන ලද කෙනෙකු අවශ්‍ය විටක වෙනස් කොට ඒ වෙනුවට වෙනත් අයෙකු නම් කිරීමට සාමාජිකයාට බලය ලැබේ. එසේ නම්කිරීම ලියවිල්ලකින් සිදු කළ යුතු අතර එම සහතිකය සාක්ෂිකරුවන් දෙදෙනෙකු ඉදිරිපිට දී සාමාජිකයා විසින් අත්සන් කොට එම සියලුම සහතික සංවිධානයේ ලේකම්වරයා විසින් ගොනුගත කර තබා ගත යුතුය.

**(13) සාමාජිකත්වය අහෝසි වීම**

පහත සඳහන් කරුණු හෝ කරුණක් නිසා හෝ සාමාජිකත්වය අහෝසි වන්නේය.

(අ) මරණය.
(ආ) සිහිවිකල් වූ බව නීත්‍යානුකූලව පිළිගෙන තිබීම.
(ඇ) මසකට කලින් ලියවිල්ලකින් දැනුම් දී සංවිධානයෙන් ඉල්ලා අස්වීම
(ඈ) අතුරු ව්‍යවස්ථාවේ 08 යටතේ සාමාජිකත්වය සඳහා අවශ්‍ය සුදුසුකම් නොමැති වීම.
(ඉ) සාමාජිකත්වය අවලංගු කිරීම හෝ සාමාජිකත්වයෙන් නෙරපා දැමීම.

(14) **සාමාජිකත්වය අවලංගු කිරීම හා සාමාජිකත්වයෙන් නෙරපා දැමීම.**

(අ. ) යම්කිසි සාමාජිකයෙකු මෙම අතුරු ව්‍යවස්ථාව කඩකළහොත් හෝ සංවිධානයේ කාරක නියෝග කඩකළහොත් හෝ සාධාරණ හේතුවක් නොමැතිව නොකඩවා මහා සභා රැස්වීම් 03 කට නොපැමිණිය හොත් ඔහුගේ සාමාජිකත්වය කාරක සභාව විසින් තහනම් කර ඒ බව මහා සභාවට දැන්විය යුතු වේ.

එවැනි අවස්ථාවල එම සාමාජිකයන්ගේ සාමාජිකත්වය අවලංගු කිරීම මහා සභා තීරණය අනුව කළ හැකිය.

(ආ) තවද, යම් සාමාජිකයෙකු සංවිධානයේ කටයුතු වලට හා ප්‍රතිපත්ති වලට හානිවන පරිදි හෝ බාධා වන පරිදි කටයුතු කළහොත් එසේම සංවිධානයේ ගරුත්වයට හානිවන අයුරින් කටයුතු කළහොත් ඉහත "අ" පරිදිම එම සාමාජිකයා සංවිධානයෙන් නෙරපා දැමිය හැක. එවැනි නෙරපා දැමීම් ද මහා සභාවකින් සම්මත විය යුතුවේ.

(ඇ) යම් සාමාජිකයෙකුගේ සාමාජිකත්වය තහනම් කර තිබෙන කාලය තුළ දී එම සාමාජිකයා සාමාජිකත්වයෙන් නෙරපීම ගැන සාකච්ඡා කරන මහා සභාවකට පැමිණ ඒ ගැන අදහස් දැක්වීමට හා ඡන්දය පාවිච්චි කිරීමට ඔහුට බලය ඇත. එහෙත් ඒ හැර සාමාජිකයෙකුට අයිති අන්‍ය කිසිම බලයක් සාමාජිකත්වය තහනම් කර තිබෙන කාලය තුළ දී ඔහුට පාවිච්චි කළ නොහැකිය.

(ඈ) ගොවි සංවිධානය විසින් තීරණය කරන ලද සාමාජික මුදල් අඛණ්ඩව වසරක කාලයක් නොගෙවා පැහැර හැරීම සිදු කරන සාමාජිකයෙකුගේ සාමාජිකත්වය අහෝසි කිරීම සිදු කළ යුතුය.

**(15)** සංවිධානයේ අරමුදල්

ගොවි සංවිධානයේ අරමුදල් පහත සඳහන් ආකාරයට ලබා ගත හැකිවේ.

(අ) සාමාජික අරමුදල් - වාර්ෂික මහා සභා රැස්වීමේ දී හෝ විශේෂ මහා සභා රැස්වීමක දී හෝ තීරණය කරන ලද පරිදි මාසිකව හෝ ත්‍රෛයිමාසිකව එක් එක් සාමාජිකයෙකුගෙන් සාමාජික මුදලක් අයකර ගත හැකිය.

(ආ) සාමාජිකයන්ගෙන් හෝ මහජනතාවගෙන් හෝ සංවිධානයට ලැබෙන පරිත්‍යාග ලෙස,

(ඇ) රජයෙන් හෝ රජය පිළිගත් වෙනත් ආයතන මඟින් හෝ ලබා දෙන පරිත්‍යාග හෝ ආධාර මුදල්,

(ඈ) තැන්පත් මුදල්,

(ඉ) සංවිධානයේ පරමාර්ථ සපුරා ගැනීම සඳහා රජයෙන් හෝ රජය අනුමත ආයතන වලින් ව්‍යාපෘති සඳහා දෙනු ලබන මුදල් හෝ පරිත්‍යාග,

(ඊ) සංවිධානය මඟින් පොහොර කෘෂිරසායන ද්‍රව්‍ය  කෘෂි උපකරණ ආදිය අලෙවියෙන් ලැබෙන මුදල් ,

(උ) ගිවිසුම් හෝ කොන්ත්‍රාත් ක්‍රමයට කරනු ලබන කාර්යන්ගෙන් ලැබෙන හෝ උපයා ගනු ලබන මුදල්,

(ඌ) ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයා විසින් සංවිධානයට ලබාගත හැකි බවට අනුමැතිය ලබා දෙන පරිත්‍යාග හෝ මුදල්,

**(16)** සංවිධානයේ අරමුදල් පරිහරණය

(අ) සංවිධානයේ කාරක සභා අනුමැතිය ඇතිව සංවිධානයේ මුදල් පරිහරණය කළ යුතු වේ.

(ආ) සංවිධානයේ අරමුදල් නිසියාකාරව පරිහරණය කිරීම ගැන කාරක සභාව මහා සභාවට වගකිව යුතු අතර මහා සභාව අරමුදල් පරිහරණය සම්බන්ධව කරුණු සොයා බැලිය යුතු වේ.

**(17)** සංවිධානයේ මහා සභාව

සංවිධානයේ උසස්ම බලය මහා සභාව මත රැදි පවතී.

**(18)** මහා සභා රැස්වීම්

(අ) සෑම වර්ෂයක් පාසාම සංවිධානයේ සංවත්සර මහා සභා රැස්වීමක් පැවැත්විය යුතුය. එක් වර්ෂයක දී එවැනි සංවත්සර මහා සභා රැස්වීමක් පවත්වා මාස 15 ක් ගත වීමට ප්‍රථම ඊළග වර්ෂයේ සංවත්සර මහා සභා රැස්වීම පැවැත්විය යුතු වන්නේය. මාස 15 ක් ගත වූ පසු ද එම ගොවි සංවිධානය විසින් සංවත්සර මහා සභා රැස්වීමක් නොපවත්වන්නේ නම් සංවිධානයේ නිලධාරීන්ගේ නිල බලය බල රහිත වන්නේය.
(ආ) සංවිධානයේ කාරක සභාවට සාමාජිකයන් තෝරා පත්කර ගැනීම සංවත්සර වාර්ෂික මහා සභා රැස්වීමේ දී කළයුතු වන්නේය.
(ඇ) ඉහත දැක්වූ සංවත්සර වාර්ෂික මහාසභා රැස්වීම හැර ඒ ඒ අවස්ථාවලදි සැලකිය යුතුව තිබෙන කරුණු ගැන සලකා බැලීම සඳහා අවශ්‍යතාවය අනුව අවම වශයෙන් මාස 03 කට හෝ 04 කට වරක් මහා සභා රැස්වීමක් පැවැත්වි යුතු වේ.
(ඈ) මේ හැර විශේෂ කටයුත්තක් යෙදෙන හදිසි අවස්ථා වල විශේෂ මහා සභා රැස්වීම් කැඳවිය හැකිය.

**(19)** මහ සභා රැස්වීම් කැඳවීම සඳහා බලය

(අ) කාරක සභාව විසින් හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය පවරන ලද කෙනෙකු විසින් හෝ සංවිධානයේ මහා සභා රැස්වීම කැඳවීමේ බලය ඇත්තේය.
(ආ) කාරක සභාව විසින් හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ ඒ සඳහා ඔහු විසින් බලය පවරන ලද කෙනෙකු විසින් හෝ සංවිධානයේ ලේකම් වෙත ලියවිල්ලකින් දැන්වූ විට ලේකම් විසින් මහා සභා රැස්වීම කැඳවිය යුතු වන්නේය.
(ඇ) ඉහත "අ" සහ "ආ" ට අමතරව සංවිධානයේ කටයුතු වලට අදාළ කරුණු ගැන සාකච්ඡා කිරීම සඳහා සංවිධානයේ සාමාජික සංඛ්‍යාවෙන් 1/5 ක් ලියවිල්ලකින් ඉල්ලා සිටින විට කාරක සභාව විසින් විශේෂ මහා සභා රැස්වීමක් කැඳවිය යුතු වන්නේය.
(ඈ) ඉහත සඳහන් පරිදි මහා සභා රැස්වීමක් පැවැත්වීමට ඉල්ලුම් කරන සාමාජිකයින් විසින් එම විශේෂ මහා සභා රැස්වීමේ දී ඉදිරිපත් කරන්නට අදහස් කරන යෝජනා එම මහා සභා රැස්වීම කැඳවීම සඳහා ඉදිරිපත් කරන ඉල්ලීම සමග ඉදිරිපත් කළ යුතු වන්නේය. මෙවැනි ඉල්ලීමක් මත විශේෂ මහා සභා රැස්වීමක් කැඳවන විට මහා සභාව කැඳවීම පිළිබඳව දැන්වීමෙහි අඩංගු න්‍යාය පත්‍රයට යෝජනා ඇතුළත් කළ යුතු වන්නේය.
(ඉ) මහා සභා රැස්වීමක් සඳහා සාමාජිකයින්ගෙන් මෙවැනි ඉල්ලීමක් ලැබුණු විට කාරක සභාව මසක් ඇතුළත එම විශේෂ මහා සභා රැස්වීම කැඳවිය යුතු වන්නේය.
(ඊ) ගොවි සංවිධානයේ කැඳවුම්කරු ලෙස අදාළ බල ප්‍රදේශයේ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරයා කටයුතු කරනු ලබන්නේය.

**(20)** මහා සභා රැස්වීම කැඳවීමට දැනුම් දීම

(අ) වාර්ෂික මහා සභාව සඳහා ද මහා සභා රැස්වීම් සඳහා ද කොමසාරිස්තුමා විසින් හෝ ඒ සඳහා බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් හෝ කැඳවීම් කරනු ලබන අවස්ථාවල දී හැර අනෙකුත් අවස්ථා වලදී මහා සභාව ගැන යටත් පිරිසෙයින් දින 07 ක් වත් කල් ඇතිව සාමාජිකයින් වෙත ලිඛිතව දැනුම් දිය යුතුය. එහිදී එම රැස්වීම් පවත්වන දිනය වේලාව සහ ස්ථානය එම රැස්වීමේ න්‍යාය පත්‍රය ද එම දැන්වීමෙහි සඳහන් විය යුතු වන්නේය.

(ආ) වාර්ෂික මහාසභා රැස්වීම කැඳවීමට අදහස් කරනු ලබන දිනය යටත් පිරිසෙයින් දින 21 ක් (විසිඑකකට) කලින් සාමාජිකයින්ට දැනුම් දිය යුතුය. කරන්නට අදහස් කරන වැඩ ගැන යටත් පිරිසෙයින් දින 07 ක් වත් කලින් දැනුම් දිය යුතුය. වාර්ෂික මහා සභා රැස්වීමක් සඳහා යවන

දැන්වීමක් සමග පසුගිය වර්ෂයේ සංවිධානයේ ආදායම් වියදම් ගිණුම හා ශේෂ පත්‍රය ද විගණන වාර්තාවේ පිටපතක් ද යැවිය යුතුය.

(ඇ) ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන කෙනෙකු විසින් සංවිධානයේ මහා සභා රැස්වීමක් කැඳවන අවස්ථාවක දී එහි පැමිණීමට බලය ඇති සාමාජිකයන්ට යටත් පිරිසෙයින් පැය 48 ක් වත් කල් ඇතිව ඒ බව දැනුම් දිය යුතුය. රැස්වීම් පැවැත්වෙන දිනය, වේලාව සහ ස්ථානය ද එම දැන්වීමෙහි සඳහන් විය යුතු වන්නේය.

(ඈ) යම් සාමාජිකයෙකු මහා සභා රැස්වීමේ දී යම් යෝජනාවක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නේ නම්, එම යෝජනාව රැස්වීම පැවැත්වීමට නියමිත දිනයට දින 14 කට කලින් සංවිධානයේ ලේකම් වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතු වන්නේය.

**(21)** මහා සභා රැස්වීමකට සහභාගි වීමට බලය ඇති අය

සංවිධානයේ ඕනෑම මහා සභා රැස්වීමකට පැමිණීමටත් එහි දී කතා කිරීමටත් ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ට ද ඔහු විසින් ඒ සඳහා බලය ලත් නිලධාරියෙකුට ද හැකි වන්නේය. තව ද මහා සභාවට ඉදිරිපත් කරනු ලබන ගණන් පරීක්ෂණ හෝ වෙනත් පරීක්ෂණ වාර්තා සකස් කිරීම සහ පරීක්ෂා කිරීම සිදුකළ නිලධාරින්ට ද මහා සභා රැස්වීම් ගැන දැනුම් දිය යුතු වන්නේය. එවැනි රැස්වීමකට පැමිණීමටත් තමන්ගේ පරීක්ෂණ වාර්තාව සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කිරීමටත් එම නිලධාරින්ට බලය ඇති වන්නේය.

**(22)** ගණපූර්ණය

(අ) ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් හෝ ඒ සඳහා ඔහු විසින් බලය පවරනු ලැබූ කෙනෙකු විසින් හෝ කැඳවනු ලබන අවස්ථාවක දී හැර අන් සෑම අවස්ථාවකදීම සංවිධානයේ මහා සභා රැස්වීමක දී තිබිය යුතු ගණපූර්ණය සංවිධානයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් 3/5 ක් විය යුතුය.
(ආ) ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන කෙනෙකු විසින් හෝ කැඳවූ රැස්වීමක දී ගණපූර්ණය යටත් පිරිසෙයින් සංවිධානයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් 1/5 ක් විය යුතුය.

(23) මූලාසනය
(අ) මහා සභා රැස්වීමක දී රැස්වීමේ මූලාසනය සභාපති විසින් දැරිය යුතුය. මහා සභා රැස්වීමකට සභාපතිවරයා හෝ උප සභාපතිවරයා යන දෙදෙනාම පැමිණ නොසිටියහොත් එම අවස්ථාවේ දී යෝජනා ස්ථිරත්වයෙන් තෝරාගත් වෙනත් සාමාජිකයෙකු විසින් රැස්වීමේ මූලාසනය ගත යුතුය.

(ආ) ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් හෝ ඒ සඳහා ඔහුගෙන් බලය ලත් කෙනෙකු විසින් මහා සභාවක් කැඳ වූ අවස්ථාවක දී ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් හෝ ඒ සඳහා ඔහුගෙන් බලයලත් කෙනෙකුට හෝ තමන් කැමති නම් මූලාසනය ගැනීමට බලය ඇත්තේය. එහෙත් එවැනි අය මූලාසනය දැරුවත් ඔහුට ඡන්දයක් පාවිච්චි කිරීමට බලයක් නොමැත.

**(24)** මහා සභාවේ තීරණ ගැනීම

(අ) සංවිධානයේ ලියාපදිංචි අතුරු ව්‍යවස්ථා මාලාවේ සංශෝධනයක් සම්මත කරනු ලබන අවස්ථාවක දී හැර අන් සෑම අවස්ථාවකදීම මහා සභාවට ඉදිරිපත් කරනු ලබන කරුණු හෝ යෝජනා වැඩි දෙනෙකුගේ

ඡන්දය අනුව තීරණය කළ යුතු වේ. මහා සභාවට ඉදිරිපත් කරන සෑම කරුණක්ම තීරණය වන්නේ ඒ ගැන කරනු ලබන යෝජනාවකිනි. ගණපූර්ණය ඇති රැස්වීමට පැමිණ සිටි නියෝජිතයින්ගෙන් ½ ට වැඩි ප්‍රමාණයක් යම් යෝජනාවකට එකඟව ඡන්දය දුන් විට එය පිළිගත් බවට සලකනු ලැබේ. එහෙත් යම් යෝජනාවකට පක්ෂව හෝ විපක්ෂව ඡන්ද ගණන එක සමාන වූ විට සභාපති තැනට තීරක ඡන්දය ප්‍රකාශ කිරීමට බලය ඇත්තේය.

(ආ) මහා සභාවට ඉදිරිපත් කරනු ලබන කිසියම් කරුණක් සම්බන්ධව ජන්ද විමසීමක් අවශ්‍ය වුවහොත් මුලසුන ගත් අය, මහා සභාවෙන් විමසා ඡන්දය දීම විවෘත හෝ රහස් ජන්ද ක්‍රමයකට හෝ කළ හැකි වන්නේය.

(ඇ) කාරක සභාවට හෝ වෙනයම් නිලයකට පත්කර ගැනීම සඳහා ඡන්ද විමසීමක් පැවැත්විය යුතු වුවහොත් එය රහස් ජන්දයෙන් හෝ විවෘත ඡන්දයෙන් කළ හැකි වන්නේය.

**(25)** මහා සභාවේ බලතල

01. කාරක සභාව විසින් ඇතුළත් කර ගන්නා ලද අලුත් සාමාජිකයින්ගේ, සාමාජිකත්වය අනුමත කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම, සාමාජිකත්වය ලබා ඇති ඕනෑම සාමාජිකයෙකුගේ සාමාජිකත්වය තාවකාලිකව තහනම් කිරීම සාමාජිකත්වය අවලංගු කිරීම හා සාමාජිකත්වයයෙන් නෙරපා දැමීම.

02. සාමාජිකත්වය තහනම් කිරීමේ කාලය දීර්ඝ කිරීම හෝ එම තහනම වලංගු කිරීම හෝ අවලංගු කිරීම.

03. සභාපති, උප සභාපති, ලේකම්, උපලේකම්, භාණ්ඩාගාරික සහ තවත් දෙදෙනෙක් සහිතව වාර්ෂිකව කාරක සභාවක් තෝරා ගැනීම.

04. කාරක සභිකයින්ගේ කාරක සභිකත්වය අහෝසි කිරීම හෝ කාරක සභික ධුරය තාවකාලිකව තහනම් කිරීම.

05. ගණන් පරීක්ෂක තැන විසින් සහතික කරන ලද ගණන් වාර්තා සහ ශේෂ පත්‍රය ද ගණන් පරීක්ෂණ වාර්තා ද ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් හෝ පරීක්ෂක තැනගේ හෝ ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් සමිතියේ කටයුතු විභාග කිරීම සඳහා නිසියාකාරව පත්කරන අයෙකුගේ පරීක්ෂණ වාර්තා ද වෙනත් ලියකියවිලි පිළිබඳව සලකා බලා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම.

06. කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන සංවිධානයේ ඉදිරි වැඩ සැලසුම් හා වෙනත් වාර්තා සලකා බැලීමෙන් පසු ඒ සම්බන්ධයෙන් තීරණ ගැනීම.

07. කාරක සභිකයින් අතරින් හෝ සංවිධානයේ සාමාජිකයින් අතරින් තෝරාගත් තිදෙනෙකුගෙන් සමන්විත අනු කමිටු වලට යම් යම් කටයුතු නියම කර ඒවා ක්‍රියාත්මක වීම ගැන සොයා බලා වාර්තා කිරීමට කාරක සභාවට පැවරීම.

08. සංවිධානය විසින් ලබා ගත හැකි ණය සීමා පිළිබඳ තීරණය ගැනීම.

09. ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයාගේ ඔහු විසින් බලය පවරනු ලැබූ නිලධාරියාගේ පූර්ව අනුමැතිය ලබා ඉඩම්, ගොඩනැගිලි, සහ යන්ත්‍රෝපකරණ මිලට ගැනීම, විකිණීම, උකස් කිරීම, උගසට ගැනීම, බද්දට දීම, බද්දට ගැනීම, ගොඩනැගිලි ඉදිකිරීම, යන්ත්‍රෝපකරණ සවිකිරීම සහ සුරැකුම්පත් ඇප තැබීම සඳහා අනුමැතිය දීම.

10.ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතියට යටත්ව අතුරු ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

11.සංවිධානයේ සාමාජිකයින්ට සපයන ණය සීමාව හා සාමාජික තැන්පත් ගැන තීරණය ගැනීම.

12. කාරක සභාව විසින් සංවිධානයේ අරමුදල් පරිහරණය කරන ආකාරය සම්බන්ධව කරුණු සොයා බැලීම.

13. සංවිධානයේ කටයුතු කරගෙන යෑමේ පහසුව සඳහා කාරක සභාව විසින් සකස්කරන ලද කාරක නියෝග අනුමත කිරීම.

14. ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරන ලද පරිදි තමාට ද අදාළ ගොවිජන සේවා කාරක සභාවේ/ගොවිජන සංවර්ධන සභාවේ සාමාජිකත්වය සඳහා තම සංවිධානය වෙනුවෙන් නියෝජිතයෙකු හෝ නියෝජිතයින් තෝරා යැවීම.
15. ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරන පරිදි හා ඔහුගේ අවසරය ඇතිව ගොවි සංවිධාන වලට සම්බන්ධිත වූ කිසියම් බල මණ්ඩලයකට හෝ කිසියම් ආයතනයකට හෝ ගොවි සංවිධානය වෙනුවෙන් නියෝජිතයන් පත්කර යැවීම.
16. සංවිධානයේ පරමාර්ථයන් ඉටුකර ගැනීම සඳහා යම් යම් කාර්යයන් ඉටු කරවා ගැනීමට අවශ්‍ය වන සේවකයකු/සේවකයින් පත් කර ගැනීම.
17. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ හා නීති හා රෙගුලාසි වලට යටත්ව ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතිය අවශ්‍ය අවස්ථාවල එම අනුමැතියට යටත්ව සංවිධානයේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය වූ ද නැතහොත් එම පරමාර්ථ ඉටුකර ගැනීමට අදාළ හා ආධාර වන්නාවූද සියලුම කටයුතු කිරිම.
18. මහා සභාවේ අනුමැතියට යටත්ව සංවිධානයේ සාමාජිකයන්ගෙන් ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන සඳහා තැන්පත්/ අනිවාර්ය තැන්පත්/ කොටස් මුදල්/ ඉතිරිකිරීම් ලබා ගැනීම හා එම වැඩසටහන යටතේ කෘෂිකාර්මික හෝ කෘෂිකාර්මික නොවන ව්‍යාපෘති සඳහා ණය ලබා දීම/ ණය අයකර ගැනීම හා පසු විපරම් කිරිම.

**(26)** මහා සභා රැස්වීම් වල වාර්තා

මහා සභා රැස්වීම් වල න්‍යාය පත්‍රයේ කරුණක් ගැන තීරණය ගත් වහාම ඊළග කරුණ ගැන සාකච්ඡාව ආරම්භ කිරිමට පෙර, පෙරකී කරුණ ගැන මහා සභාව විසින් ගත් තීරණයේ ලුහුඩු සටහනක් වාර්තා පොතේ සඳහන් කර එය මහා සභාව ඉදිරියේ කියවා ඊට සභාපතිතුමාගේ හා ලේකම් තුමාගේ අත්සන් තැබිය යුතුය. සෑම මහා සභාවකම වාර්තාව එම මහා සභාවට පසුව පවත්වන පළමුවෙනි කාරක සභා රැස්වීමට, ලේකම්තුමා විසින් ඉදිරිපත් කළ යුතුය.

**(27)** කාරක සභාව

1. සංවිධානයේ කටයුතු කරගෙන යාම සඳහා කාරක සභාවක් තිබිය යුතුය. එය 7 දෙනෙකුට නොඅඩු ගණනකින් සමන්විත විය යුතු අතර, ඔවුන් මහා සභාව විසින් සමිතියේ සාමාජිකයින් අතුරින් පත් කර ගත යුතුය.
2. තෝරා පත් කර ගන්නා ලද කාරක සභිකයින්ගේ නිල කාලය සංවිධානයේ ඊළග වාර්ෂික මහා සභා රැස්වීමේ දී අවසන් වේ. එසේ නිල කාලය අවසන් වූ කාරක සභිකයෙකු මහා සභාවේ තීරණය අනුව අවශ්‍ය නම් නැවතත් තෝරාගත හැකිය.
3. තෝරා පත් කර ගන්නා ලද කාරක සභිකයෙකුගේ මරණයෙන් හෝ ඉල්ලා අස්වීමෙන් හෝ වෙනයම් කරුණකින් හෝ කාරක සභාවේ පුරප්පාඩුවක් ඇති විට ඊළගට පැවැත්වෙන සංවිධානයේ මහා සභා රැස්වීමේ දී සමිතියේ සාමාජිකයින් අතුරින් පුරප්පාඩු සඳහා කාරක සභිකයින් තෝරා පත්කර ගැනීම කළ යුතුය.( කාරක සභාවට සාමාජිකයින් තෝරා පත් කර ගැනීමේ දී සෑම සාමාජිකයෙකුටම කාරක සභිකයෙකු වීමට අවස්ථාවක් ලබා දෙන්නේ නම් සෑම සමාජිකයෙකුටම ක්‍රියාකාරි වශයෙන් සංවිධානයේ කටයුතු වලට සහභාගී වීමට ඉඩ ලැබෙන බව සැලකිය යුතුය.)

(28) කාරක සභිකත්වය අහිමි වීම

සංවිධානයේ පරමාර්ථවලට පටහැනිව කටයුතු කරන හා සංවිධානයේ ගරුත්වයට හානිවන අන්දමින් කටයුතු කරන යම් කාරක සභිකයෙකුගේ කාරක සභිකත්වය මහා සභාවේ වැඩි ඡන්දයෙන් අහිමි කළ හැකිවේ.

(29) කාරක සභා රැස්වීම

සංවිධානයේ කටයුතු සඳහා අවශ්‍යතාවය අනුව ඕනෑම වේලාවක හෝ යටත් පිරිසෙයින් මසකට වරක්වත් කාරක සභා රැස්වීමක් පැවැත්විය යුතු වන්නේය.

(30) ගණ පූර්ණය

කාරක සභාවේ ගණපූර්ණය එහි සාමාජික සංඛ්‍යාවෙන් 2/3 ක් විය යුතුය.

(31) කාරක සභා රැස්වීම් වාර්තා

කාරක සභා රැස්වීමේ දී සාකච්ඡා කරගත් කරුණු සහ ගන්නා ලද තීරණ වාර්තා පොතක ලේකම් විසින් සටහන් කළ යුතු වේ. රැස්වීමේ දී මුලසුන ගත් අය හා එහි පැමිණ සිටි අනෙකුත් කාරක සභිකයින් විසින් රැස්වීම් අවසානයේ දී එම වාර්තා අත්සන් තැබිය යුතු වන්නේය.

(32) කාරක සභාවේ නිලධාරීන්

කාරක සභාවේ නිලධාරීන් පත්කිරීමේදී ගොවි සංවිධානයේ සාමාජිකයින්ගෙන් පමණක් අදාල තනතුරු වලට නිලධාරීන් පත් කළ යුතු අතර ආශ්‍රිත සාමාජිකත්වය දරන අයෙකු ඒ සඳහා සුදුසුකම් නොලබන්නේය

කාරක සභාවේ තනතුරු හොබවන සභාපති,උප සභාපති, ලේකම්, උපලේකම් හා භාණ්ඩාගාරික කාරක සභාවේදී එම තනතුරු දැරිය යුතුය.

1. සභාපති

   කාරක සභාවේ සභාපති විසින් සංවිධානයේ කටයුතු මෙහෙයවිය යුතු අතර, එහි අභිවෘද්ධිය සම්බන්ධව මූලිකව ක්‍රියා කල යුතුය.

2. උප සභාපති

   කාරක සභාවේ උප සභාපති නැති අවස්ථා වලදි ඔහු වෙනුවෙන් වැඩ බැලීම හා ඔහුට නියමිත රාජකාරි කටයුතු කළ යුතුවේ.

3 ලේකම්.

   කාරක සභාවේ ලේකම් කාරක සභාවේ වාර්තා පොත් තබා ගැනීම සහ කාරක සභාවේ තීරණයන් හෝ මහා සභාවේ තීරණයන් සම්බන්ධයෙන් කටයුතු කිරිම හා අවශ්‍ය පරිදි කාරක සභාවේ හෝ මහා සභාවේ රැස්වීම් කැඳවීම කළ යුතු වන්නේය.

4 උප ලේකම්

   ලේකම් නොමැති අවස්ථා වලදි ඔහුගේ රාජකාරි කටයුතු කිරිම හා ඔහු සිටින අවස්ථාවලදී ඔහුට සහාය දීම උප ලේකම් විසින් කළ යුතු වේ.

5 භාණ්ඩාගාරික

සංවිධානයේ මුදල්වල භාරකාරත්වය හා සංවිධානයෙන් කෙරෙන මුදල් ගණුදෙනුවලට වගකීම, වාර්ෂික මහා සභාවේ දී වාර්ෂික විගණනය කරන ලද ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීම සංවිධානයේ ලේඛණ හා පොත්පත් පවත්වා ගෙන යාම යනා දී කළයුතු වන්නේය.

(33) කාරක සභාවේ වගකීම

කාරක සභාව තම බලතල හා යුතුකම් මනා ලෙස ඉටු කළ යුතු වන්නේය. සෑම විටම නීතියට හා මෙම අතුරු ව්‍යවස්ථාවල විධිවිධානයන්ට අනුව හා ගොවිජන සංවර්ධන කොමසාරිස්ජනරාල්වරයාගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරින්ගේ උපදෙස් වලට අනුව කටයුතු කළයුතු වන්නේය.

34). **නීතියෙන් හා මෙම අතුරු ව්‍යවස්ථාවලින් හෝ කෙරෙන සීමාවලට මහා සභාවේ අනුමැතියට යටත්ව පහත සඳහන් බලතල හා යුතුකම් කාරක සභාවට පැවරී ඇත.**

1. මහා සභාවේ අනුමැතියට යටත්ව සාමාජිකයන් ඇතුළත් කර ගැනීම.
2. සංවිධානයේ ඉදිරි වැඩ සැලසුම් සකස් කිරිම හා ඒවා ක්‍රියාවේ යෙදවීම.
3. මහා සභාවේ අනුමැතියට යටත්ව සංවිධානයේ කටයුතු සඳහා අවශ්‍ය ඉඩම්, ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ, මිලයට ගැනීම, විකිණීම, උකස් කිරිම, උකසට ගැනීම, බදුදීම, බදු ගැනීම, ගොඩනැගිලි ඉදි කිරිම,යන්ත්‍රෝපකරණ සවිකිරිම.
4. සංවිධානය වෙනුවෙන් ගිවිසුම් වලට ඇතුළත් වීම හා ඒ වෙනුවෙන් අත්සන් තැබීම සඳහා සභාපතිතුමාට හා ලේකම්තුමාට බලය දීම.
5. මහා සභාව විසින් නියම කරන ලද පරිදි හා නියම කරන ලද ප්‍රමාණයන් අනුව සංවිධානය වෙනුවෙන් මුදල් ණයට ගැනීම, තැන්පත් මුදල් භාර ගැනීම හා මුදල් ආපසු ගෙවීමේ දී ඒ සඳහා කොන්දේසි සකස් කිරිම.
6. අතුරු ව්‍යවස්ථාවෙන් අවසර ලැබී ඇති පරිදි සාමාජිකයින්ට ණය දීම( ද්‍රව්‍ය හා මුදල් වශයෙන්) හා අත්තිකාරම් ලබා දීම.
7. ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද ක්‍රියාපිළිවෙලට අනුව හා මහා සභාවේ තීරණ අනුව සංවිධානයේ කටයුතුවලට අවශ්‍ය සේවකයින් බඳවා ගැනීම, පුහුණු කිරිම හා විනයානුකූල පාලනය
8. මහා සභාව විසින් සංවිධානයේ දී විවිධ විශේෂ කරුණු ඉටු කිරිම සඳහා පත් කර ගන්නා ලද අනු කාරක සභාවල කටයතුවල, ප්‍රගතිය මහා සභාව වෙත දැන්වීම.
9. සංවිධානයේ අරමුදල් පරිහරණය කිරිම ගැන මහා සභාවට වගකීම.
10. කාරක නියෝග මාලාව සකස් කිරිම.
11. සංවිධානයේ ගනුදෙණු, අලෙවිය, සාමාජික ණය තැන්පත් ආදිය ගැන නිවැරදි ගිණුම් තබා ගැනීම.
12. සංවිධානයේ සියලුම වත්කම් හා පොත්පත් ලිපි ලේඛණ ආදිය ආරක්ෂිතව පවත්වාගැනීම.

**(35)** ගොවි සංවිධානයේ අනු කමිටු

**ගොවි සංවිධානයේ වාර්ෂික මහා සභා රැස්වීමේ දී හෝ වෙනත් රැස්වීමක දී සාමාජිකයින්ගේ මනාපය පරිදි, ගොවි සංවිධාන වල පරමාර්ථ ඉටු කර ගැනීමට විශේෂ අවධානය යොමු වියයුතු විවිධ කාර්යයන් සාර්ථකව ඉටුකරවා ගැනිමට පහත පරිදි වන අනුකමිටු එකක් හෝ ඊට වැඩි ගණනක් පත් කර ගත යුතුය.**

1. **ගොවි සංවිධානයේ සෑම අනුකමිටුවකම අවම වශයෙන් කාරක සභාවේ එක් සාමාජිකයෙක්වත් සිටිය යුතු අතර, ඔහු එම අනුකමිටුවේ සභාපතිත්වය දැරිය යුතු වන්නේය.**
2. **සෑම අනු කමිටුවකම සාමාජිකයින් ගණන අවම වශයෙන් 7ක් වත් විය යුතුය.**
3. **අනුකමිටුව මගින් ගනු ලබන තීරණ වහාම කාරක සභාවට යොමු කර, කාරක සභාවේ අනුමැතිය පරිදි එම තීරණ කාරක සභාව මගින් හෝ අනුකමිටුව මගින් හෝ ක්‍රියාත්මක කළ හැකි අතර, මේ**

සම්බන්ධව කාරක සභාව විසින් මහා සභාවට වාර්තා කළ යුතු අතර මහා සභාවේ අනුමැතිය ලබා ගත යුතුය.

අදාළ අනු කමිටු පහත පරිදි විය යුතුය.

I. පරිසර අනු කමිටුව
II. ජල කළමණාකරණ අනු කමිටුව
III. කෘෂිකාර්මික අනු කමිටුව
IV. මූල්‍ය ශක්තිය වැඩිදියුණු කිරිමේ අනු කමිටුව
V. සමාජ සුභසාධන අනුකමිටුව
VI.

ඉහත එක් එක් අනු කමිටුවේ කාර්යයන් පහත පරිදි ක්‍රියාත්මක කළ යුතු වේ.

- පරිසර අනු කමිටුවේ කාර්යය -

I. ප්‍රදේශයේ පරිසරය සුරැකිම සඳහා එකතු වීම හා පරිසරය සුරැකිමට අවශ්‍ය පියවර ගැනිම.
II. රක්ෂිත හා පරිසර සංවේදී කලාප හඳුනා ගැනීම හා ආරක්ෂා කිරිම.
III. ජල මූලාශ්‍ර ආරක්ෂා කිරිම.
IV. හඳුනාගත් ප්‍රදේශ වල රුක්රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.
V. පාරිසරික කටයුතු පිළිබඳව සාමාජිකයන් දැනුවත් කිරිම
vi රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලින් මූල්‍ය පහසුකම් ලබාගෙන සුදුසු පරිසර හිතකාමි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම

- ජලකළමණාකරණ අනු කමිටුව -

I. ජල මුර ක්‍රම සකස් කිරිම හා ක්‍රියාත්මක කිරිම.
II. වැව් අමුණු ඇතුලු සියලු වාරි නිර්මිත අළුත්වැඩියාව හා මනා නඩත්තුව.
III. වාරි කර්මාන්ත අධීක්ෂණය,පාලනය හා ආරක්ෂාව
IV. වගාවට අවශ්‍ය ජලය කළමනාකරණය කිරිමට අවශ්‍ය පියවර ගැනීම
V. වාරිමාර්ගයකට, ඇළකට, ජල මාර්ගයකට, වාරි රක්ෂිතයකට අපද්‍රව්‍ය දැමීම සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය පියවර ගැනීම.
VI. වාරි කර්මාන්ත වලට බාධා පැමිණවීම, අලාභ හානි කිරිම පිළිබඳව අදාල නිලධාරීන් දැනුවත් කිරිම.
VII.

- කෘෂිකාර්මික අනු කමිටුව

I. ගොවි සංවිධානය වාර්ෂිකව සකස් කරනු ලබන කෘෂිකර්ම ක්‍රියාත්මක සැලැස්ම නියමිත කාල රාමුව තුල ක්‍රියාත්මක කිරිම හා පසු විපරම.
II. සාම්ප්‍රදායික වගා ක්‍රම, පිළිගත් චාරිත්‍ර වාරිත්‍ර, රීති ක්‍රියාත්මක කිරිම සහ පටහැනිව කටයුතු කරන්නන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

III. වගා නොකරන වගා කළ හැකි කුඹුරු හා ගොඩ ඉඩම් හඳුනා ගැනීම හා කාර්යක්ෂමව වගා කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

IV. කෘෂිකාර්මික ඉඩම් වල ප්‍රමාණය, පිහිටීම හා ස්වභාවික සම්පත් සැලකිල්ලට ගෙන බෝග වගාව, සත්ව පාලනය කාර්යක්ෂම කිරීම.

V. නව කෘෂිකාර්මික තාක්ෂණය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම.

VI. පස සහ ජලය ආරක්ෂා කිරීම සඳහා කාබනික පොහොර යෙදීම, පාංශු සංරක්ෂණය හා නියමිත ප්‍රමාණයන්ගෙන් නිර්දේශිත රසායනික පොහොර යෙදීම පිළිබඳව කටයුතු කිරීම.

VII.

- මූල්‍ය ශක්තිය වැඩි දියුණු කිරීමේ අනු කමිටුව

I. ගොවි සංවිධාන අතුරු ව්‍යවස්ථාවට අනුකූලව අරමුදල් සම්පාදන වැඩසටහන් හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම.

II. බල ප්‍රදේශය තුල කොන්ත්‍රාත් ගොවි සංවිධානයේ සෘජු මෙහෙයවීම යටතේ සිදු කිරීම.

III. කෘෂි නිෂ්පාදන අලෙවි කිරීමට අදාලව අතරමැදියෙකු ලෙස කටයුතු කිරීම.

IV. කෘෂි යන්ත්‍රෝපකරණ සේවා සැපයීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

V. රාජ්‍ය හා පිළිගත් පෞද්ගලික ආයතන වලින්, මහජනතාවගෙන් ආධාර හා පරිත්‍යාග ලබා ගැනීමට අදාල ආයතන හා පුද්ගලයන් සම්බන්ධීකරණය කිරීම.

VI.

- සමාජ සුභසාධන අනු කමිටුව

I. ගොවි සංවිධාන සාමාජිකයන් සඳහා වෛද්‍ය සායන පැවැත්වීම.

II. ස්වභාවික ව්‍යසන අවස්ථාවන්හිදී අවශ්‍ය වන ආධාර උපකාර කිරීම.

III. සාමාජිකයන්ගේ අධ්‍යාත්මික ගුණ වගාව වැඩි දියුණු කිරීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

IV. සාමාජිකයන්ගේ දැනුම කුසලතා,ආකල්ප වැඩිදියුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

V. අඩු ආදායම්ලාභී පවුල් වල අධ්‍යාපනය හදාරන දරුවන් සඳහා ශිෂ්‍යාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

VI.

**(36) ගොවි සංවිධානයේ අරමුදල් යෙදවීම.**

අතුරු ව්‍යවස්ථාවේ අංක 16 අනුව සංවිධානයේ අරමුදල් සාමාජිකයන්ගේ යහපත හා සංවිධානයේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා යෙදිය හැකි වන්නේය.

1. මීට අමතරව මහා සභාවේ අනුමැතිය සාමාජිකයන්ගේ පොදු සුභ සාධන කටයුතු සඳහා මහා සභාව විසින් තීරණය කරන ලද මුදල් ප්‍රමාණයක් පාවිච්චි කළ හැකිය.

2. ගොවි සංවිධානය විසින් සාමාජික නොවන, කිසිම කෙනෙකුට ද්‍රව්‍ය වශයෙන් හෝ මුදල් වශයෙන් හෝ ණය දීම සඳහා සංවිධානයේ අරමුදල් පාවිච්චි නොකළ යුතුය.

3. සාමාජිකයන්ට දෙන ණය සෑම විටම ද්‍රව්‍ය වශයෙන් ලබා දීමට කටයුතු කළ යුතුය.

4. ණය දිය හැකි වන්නේ සාමාජිකයන්ගේ නිෂ්පාදන කටයුතුවලට, ආදායම් උපදවන කටයුතුවලට හා සාමාජිකයින්ගේ අභිවෘද්ධියට ඉවහල් වන කටයුතු සඳහාය.

5. ගොවි සංවිධානයේ අරමුදල් නියමිත රාජ්‍ය බැංකුවක හෝ ගොවිජන බැංකුවේ තැන්පත් කළයුතු අතර එම බැංකු ගිණුම් පවත්වාගෙන යාම හා ඒ සම්බන්ධ කටයුතු සඳහා ගොවි සංවිධානයේ සභාපති ඇතුලු තවත් දෙදෙනෙක් සභාව තුළින් තෝරාපත් කර ගත යුතු අතර, බැංකු ගනුදෙනු වලදී චෙක්පත් අත්සන් කිරීම සඳහා ඉන් දෙදෙනෙකු වෙත බලය පැවරිය යුතුය. චෙක්පත් අත්සන් කිරීමේ බලය ලැබෙන දෙදෙනාගේ නම් මහා සභා රැස්වීමක දී අනුමත කරවා ගත යුතුවේ.

**(37)** සංවිධානයේ ගිණුම්

(1) ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් හෝ ඒ සඳහා සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය දෙන ලද නියෝජිතයෙකු ගොවි සංවිධානයේ ගිණුම් පරීක්ෂා කළ යුතු වේ.

(2) ගිණුම් පරීක්ෂක නිලධාරීන් විසින් ගොවි සංවිධානයේ පරීක්ෂා කරන ලද ගිණුම් වාර්තාවේ එක් පිටපතක් ගොවිජන සංවර්ධන කොමසාරිස්වරයාට හෝ මෙම කාර්යය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ඔහු විසින් බලය පවරනු ලැබූ නිලධාරියාට යැවිය යුතු වේ.

(3) ගිණුම් පරීක්ෂණ වාර්තා යම් සාමාජිකයෙකුගේ දැන ගැනීම සඳහා ගොවි සංවිධානයේ ලේකම්ගෙන් හෝ සභාපතිගෙන් ලිඛිතව ඉල්ලා සිටි අවස්ථාවක දී වාර්තාවේ පිටපතක් ගොවි සංවිධානයේ ලේකම් විසින් එම සාමාජිකයාට සැපයිය යුතු වේ.

(4) සෑම වාර්ෂික මහා සභා රැස්වීමකදීම ඉකුත් වර්ෂයේ ගිණුම් කටයුතු පිළිබඳව වාර්තාවක් ගොවි සංවිධානයේ භාණ්ඩාගාරික විසින් මහා සභාවට ඉදිරිපත් කළ යුතු වේ. එම වාර්තාවට ගිණුම් පරීක්ෂකගේ වාර්තාව ද ඇතුළත් කළ යුතුය. භාණ්ඩාගාරික විසින් සකස් කරන ලද ගිණුම් වාර්තාව වාර්ෂික මහා සභාවට ඉදිරිපත් කර එය අනුමත කරවා ගැනීම කාරක සභාවේ වගකීමකි.

(5) ගිණුම් කටයුතු සම්බන්ධයෙන් ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ නිලධාරියෙකු විසින් දෙනු ලබන උපදෙස්වලට අනුව කටයුතු කිරීමට කාරක සභාව බැඳී සිටී.

(6) නීතියට හා ගොවි සංවිධානයේ නියෝග වලට අනුකූලව සංවිධානයේ ගිණුම් පවත්වාගෙන යා යුතු වන්නේය.

**(38)** මුදල් වර්ෂය

ගොවි සංවිධානයේ මුදල් වර්ෂය සෑම අවුරුද්දකම ජනවාරි මාසයේ 01 වන දින සිට දෙසැම්බර් මාසයේ 31 වන දින දක්වා වන්නේය.

**(39)** අතුරු ව්‍යවස්ථා සංශෝධනය

ගොවි සංවිධානයේ සම්පූර්ණ සාමාජික සංඛ්‍යාවෙන් 2/3 කගේ ඡන්දය ඇතිව පමණක් මෙම ගොවි සංවිධානයේ අතුරු ව්‍යවස්ථාව සංශෝධනය කර ගත හැකි වන්නේය. එසේ කරනු ලබන සංශෝධන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය ලැබීමෙන් අනතුරුව ක්‍රියාත්මක කළ හැකි වන්නේය.

**(40)** වචනාර්ථ

1. මෙම අතුරු ව්‍යවස්ථාවේ ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයා හෝ කොමසාරිස්වරයා යනු "ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් හෝ ගොවිජන සංවර්ධන කොමසාරිස් හෝ ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් හෝ ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්" වේ.

2. "ගොවි සංවිධාන" යන්නට ගොවිජන සංවර්ධන පනත යටතේ ලියාපදිංචි කරන ලද සංවිධාන අර්ථවත් වේ.

3. "නීතිය" හා "රෙගුලාසි" යන්නට ගොවිජන සංවර්ධන පනත හා ඒ යටතේ විෂයයන්ට අදාලව අමාත්‍යවරයා විසින් සකස් කරන ලද "නියෝග"යන්න අර්ථවත් වේ.

ඉහත සඳහන් අතුරු ව්‍යවස්ථාව........................................................ගොවිජන සේවා බල ප්‍රදේශයේ පිහිටි.................................................................................................................................

.................................................................................................................................................

(ගොවි සංවිධානයේ නම හා ලිපිනය)

ගොවි සංවිධානය ලියාපදිංචි කිරීමට යවන ලද ඉල්ලුම් පත්‍රය අත්සන් කලාවූ ද හෝ නැතහොත් මෙහි පහත අත්සන් කර ඇත්තා වූද, සාමාජිකයන් .................................................. දෙදෙනෙකුගෙන් යුක්තව 20 ............. ............................ මස ....................... දින පවත්වන ලද්දා වූ මහා සභා රැස්වීමේ දී පිළි ගන්නා ලදි.

.........................................
සභාපතිගේ අත්සන

.........................................
ලේකම්ගේ අත්සන

.........................................
සභාපතිගේ නම

.........................................
ලේකම්ගේ නම

| සාමාජිකයාගේ නම | ලිපිනය | අත්සන |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 6. | | |
| 7. | | |

මෙම අතුරු ව්‍යවස්ථාව, 20 ............................ මස ......................... දින, ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස් ....................................... විසින් අනුමත කොට අංක: ................

(දිස්ත්‍රික්කය)

........................යටතේ ලියාපදිංචි කරන ලදි.

.................................................................
අත්සන

........................................................

නම

ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස්,

........................................................ දිස්ත්‍රික්කය

දිනය :- ................................................

# ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බලමණ්ඩලයේ ව්‍යවස්ථාව

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

59

I. ලියාපදිංචි අංකය - DAD/SLNFOF/ 2014

II. ලියාපදිංචි කළ දිනය - 2014.08.13

III. නාමය - ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලය

IV. ලිපිනය - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 42,
ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත, තැ.පෙ.537, කොළඹ 07.

V. බලප්‍රදේශය - ශ්‍රී ලංකාව

## 1.පරමාර්ථ-

කෘෂිකාර්මික කටයුතු වල නියැලෙන ජනතාවගේ ආදායම් හා සාමාජීය තත්ත්වය වර්ධනය කර ගැනීම සඳහා

1) ගොවිතැන් හා කෘෂිකාර්මික කටයුතු වලට අවශ්‍ය යෙදවුම් ,බීජ ,උපකරණ හා ණය පහසුකම් ලබාගැනීම.

2) ගොවීන්ගේ කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා අලෙවි පහසුකම් ඇති කරගැනීම හා නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් ලබාදීම.

3) ගොවීන් හා අනිකුත් ගොවි සංවිධාන සැකසුරුවම් හා ඉතිරි කිරීම සඳහා පෙළඹවීම.

4) ආණ්ඩුවේ කෘෂිකාර්මික ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම හා එම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වැඩසටහන්, ව්‍යාපෘති, උපායමාර්ග ක්‍රියාවට නැංවීම.

5) ගොවීන් සම්බන්ධ වෛද්‍ය ගැටළු වලදී අවශ්‍ය අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීම.

6) සංවර්ධන යෝජනා සම්බන්ධයෙන් ජාතික මට්ටමේ තීරණ ගැනීමේදී ගොවීන් නියෝජනය කිරීම.

7) ගොවි සංවිධාන ව්‍යාපාරික මට්ටමට ගෙන ඒමට ශක්තිමත් කිරීම.

8) කෘෂිකර්මයට අදාල වාරි පරිසර පද්ධති සංරක්ෂණය හා කෘෂිකර්මයට අදාල සාම්ප්‍රදායික නීති [illegible]නය කිරීම.

## 02.බලතල

ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බලමණ්ඩලයේ පරමාර්ථ ඉටුකරගැනීම මෙම ව්‍යවස්ථාව අනුව පහත සඳහන් බලතල සංවිධානයට තිබේ.

01. සංවිධානයේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වන නිශ්චල දේපල වන ඉඩම්,ගොඩනැගිලි හා චංචල දේපල වන යන්ත්‍රෝපකරණ හෝ රථ වාහන ආදිය මිළට ගැනීම, විකිණීම ,උකස් කිරීම කුලියට දීම, බදු දීම, අනු බදු දීම, ගොඩනැගිලි ඉදි කිරීම, අලුත් වැඩියාව , නඩත්තුව වෙනත් ආකාරයෙන් කටයුතු කිරීම.

02. ලියාපදිංචි ගොවි සංවිධාන වලට ගොවිජන සංවර්ධන සභා වලට, ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩල වලට සහ ගොවි සංවිධාන පළාත් බල මණ්ඩල වලට ආධාර සහ සහය ලබා දීම.

03. ලියාපදිංචි ගොවි සංවිධාන වලට ගොවිජන සංවර්ධන සභාවලට ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩල වලට සහ ගොවි සංවිධාන පළාත් බල මණ්ඩල වලට ස්වකීය කර්තව්‍ය ඉටුකිරීමට හැකිවන පරිදි ඒවාට අවශ්‍ය මාර්ගෝපදේශකත්වය ලබා දීම.

04. ජාතික කෘෂි කර්ම කමිටුවට නියෝජිතයෙකු තෝරාපත් කරගැනීම .

05. ආණ්ඩුවේ කෘෂිකාර්මික ප්‍රතිපත්තිය පිළිබඳ ආණ්ඩුවට යෝජනා හා අදහස් ඉදිරිපත් කිරීම.

07. ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලයේ ක්‍රියාවක් හෝ නඩු කටයුත්තක් එහි සාමාජිකයන් අතර පුරප්පාඩුවක් පැවතීම හේතුව නිසාම පමණක් නිර්බල වූ ලෙස සලකනු නොලැබිය යුතුය.

08. කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවිය පිළිබඳ ගොවි සංවිධාන වලට ,ගොවිජන සංවර්ධන සභාවලට ගොවි සංවිධාන දිස්ත්‍රික් බලමණ්ඩල වලට සහ ගොවි සමාගම් වලට උපදෙස් හා සහය ලබාදීම.

09. කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවි කිරීමෙහිලා කුඩා ගොවි කණ්ඩායම් වලට උපදෙස් හා සහය ලබාදීමේ හා ඒවා දිරිගැන්වීම.

10.කෘෂිකර්මය සංවර්ධනය කිරීමේ අදහසින් නිලධරයන් හා ගොවීන් පුහුණු සඳහා මූලාධාර සැපයීම.

11.කෘෂිකර්ම විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය විසින් ආරම්භ කරන ලද වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

12.නියමිත බැංකුවක ගිණුමක් පවත්වාගෙන යාමේ හා කොමසාරිස් ජනරාල් විසින් කලින් කල නිකුත් කරනු ලබන උපදෙස් වලට අනුකූලව ඒ ගිණුම ක්‍රියාත්මක කිරීම.

13.ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලය ලියාපදිංචි කල දින පටන් හා ඉන්පසුව අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතුය එම සංස්ථා නාමයෙන් නඩු පැවරීමට හෝ එයට විරුද්ධව නඩු පවරනු ලැබීම කළ හැකිය.

14.ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලයේ සියළුම නිලධරයන් හා සාමාජිකයින් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සැලකිය යුතුය.

15. ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලයේ නිලධාරියෙකු හෝ සාමාජිකයෙකු විසින් ගොවිජන සංවර්ධන පනත යටතේ හෝ එය යටතේ සාදනු ලැබූ යම් නියෝගයක් යටතේ හෝ

සද්භාවයෙන් කරන ලද හෝ කරනු ලදැයි සැලකෙන ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව සිවිල් හෝ අපරාධ නඩුවක් හෝ නොපැවරිය යුතුය.

16.මෙම ව්‍යවස්ථාවේ පරමාර්ථ සපුරාගැනීමට අවශ්‍ය හෝ ආධාර වන වෙනත් කාර්යයන් මෙම ව්‍යවස්ථාවට හා ගොවිජන සංවර්ධන පනතට හා අදාළ නියෝග වලට අනුකූල කිරීම.

17.රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහය යටතේ මහා භාණ්ඩාගාරය විසින් අනුමත සමිති වෙත ප්‍රමාණවත් බලතල හා වගකීම් ක්‍රියාත්මක කිරීමේ හැකියාව.

## 03-බල මණ්ඩලයේ කාර්යාලයක් පවත්වාගෙන යාම

ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලය ස්වකීය කාර්යාලය කොළඹ පවත්වා ගෙන යායුතුය.

## 04- කාර්යයන්

1. ගොවි නිෂ්පාදන අලෙවි කිරීමේදී අන්තර් දිස්ත්‍රික් හුවමාරු ක්‍රම ක්‍රියාත්මක කිරීමට සහාය උපදෙස් ලබාදීම .
2. ගොවි නිෂ්පාදන අලෙවි කිරීමේදී දීප ව්‍යාප්තව අලෙවි සංවිධාන,ගබඩා පහසුකම් ඇතිකිරීම හා එම කටයුතු සම්බන්ධීකරණය කිරීම.
3. ගොවි සංවිධානවල යෙදවුම් අවශ්‍යතා ඉටු කර ගැනීමට සැලසුම් සකස් කිරීම හා ක්‍රියාවට නැංවීම.
4. ගොවි සංවිධාන වලට අවශ්‍ය කෘෂි උපකරණ, යන්ත්‍ර සූත්‍ර ආදිය පහසු මිලට ලබාගැනීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු.
5. ජාතික කෘෂිකාර්මික සැලසුම් සකස් කිරීමේදී රජයේ හා රජයේ නොවන ආයතන සමග කටයුතු කිරීම හා ඒ සඳහා අවශ්‍ය නිලධාරීන්ගේ උපදෙස් ලබාගැනීම.
6. වෙළඳ පොළ අවශ්‍යතා සමග නිෂ්පාදනයන් දිරිගැන්වීමට ගොවි සංවිධාන පෙළඹවීම හා උපදෙස් දීම.
7. අස්වැන්න වැඩිකිරීමේ ක්‍රම හා නවීන තාක්ෂණික ක්‍රම ගැන ගොවි සංවිධාන වලට දැනුම ලබාදීම සඳහා අදාළ දෙපාර්තමේන්තු හා ආයතන සමග සම්බන්ධීකරණය කර ගොවි පුහුණු පංති ජාතික මට්ටමින් සංවිධානය කිරීම.
8. ගොවි සංවිධාන වලට විශේෂ ව්‍යාපෘතීන් ආරම්භ කිරීමට අවශ්‍ය සැලසුම් සඳහා උපදෙස් හා මග පෙන්වීම, පුහුණුව හා නිෂ්පාදන අලෙවි පහසුකම් ලබාදීමට මැදිහත්වීම.
9. ගොවි නිෂ්පාදන වල නාස්තිය හා අපතේයාම වලක්වා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම..
10. දේශීය කෘෂි සංස්කෘතිය ආරක්ෂාකිරීමට අවශ්‍ය පියවර ගැනීම.
11. කාබනික පොහොර භාවිතය ව්‍යාප්ත කිරීම සහ ප්‍රචලිත කිරීම.
12. ගොවි ජනතාවගේ සහයෝගීතාව වර්ධනය වීමට හා ජීවන තත්ත්වය නගාලීමට ඉවහල්වන වෙනත් සේවා ඉටුකිරීම සඳහා නායකත්වය ලබාදීම කටයුතු කිරීම.
13. කෘෂිකර්ම ක්ෂේත්‍රයේ පුහුණු, අධ්‍යයන, පර්යේෂණ ආදිය සඳහා සහාය වීම.
14. ගොවීන්ට සමස්ථයක් ලෙස බලපාන සෞඛ්‍යමය හා වෙනත් ගැටළු වලදී රජයට අවශ්‍ය සහය ලබාදීම හා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

## 05- ජාතික ගොවි සංවිධාන බලමණ්ඩලයේ මහා සභාව හා මහ සභා රැස්වීම

01. ජාතික ගොවි සංවිධාන බලමණ්ඩලයේ උසස්ම බලය මහා සභාව මත රැදී පවතී.
02. අවම වශයෙන් මාස 12 කට වරක් සංවිධානයේ මහා සභා රැස්වීමක් පැවැත්විය යුතුය. වසර තුනකට (03) කට වරක් සංවත්සර මහා සභා රැස්වීමක් පැවැත්විය යුතුය.
03. සංවිධානයේ කාරක සභාවට සාමාජිකයන් තෝරාපත් කරගැනීම සංවත්සරික මහා සභා රැස්වීමේදී කලයුතු වන්නේය.
04. ඉහත දැක්වූ මහා සභා රැස්වීම හැර ඒ ඒ අවස්ථාවලදී සැලකිය යුතුව තිබෙන කරුණු ගැන සලකා බැලීම සඳහා අවශ්‍යතාව අනුව විශේෂ කටයුත්තක් යෙදෙන අවස්ථාවල මහා සභා රැස්වීම පැවැත්විය හැකිය.

## 06- මහා සභා සාමාජිකත්වය

01.වයස අවුරුදු 18 සම්පූර්ණ කර තිබීම

02. එක් එක් දිස්ත්‍රික් ගොවි සංවිධාන බල මණ්ඩලයකින් තෝරාපත් කරනු ලැබූ නියෝජිතයින් තිදෙනෙක් බැගින් දිස්ත්‍රික්ක 25 සඳහා නියෝජිතයින් 75දෙනෙකු තෝරාපත් කර ගත යුතුය. ඔවුන් ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලයේ මහා සභාව නියෝජනය කරයි.

03. මෙම තෝරාපත් කරගන්නා නියෝජිතයින් තිදෙනා දිස්ත්‍රික් ගොවි සංවිධාන බලමණ්ඩලයේ වත්මන් සභාපති, උපසභාපති, ලේකම්, උපලේකම්, භාණ්ඩාගාරික යන නිලතල දරණ පුද්ගලයින්ගෙන් 03 දෙනෙකු වියයුතුය.

04. ආණ්ඩුවේ දෙපාර්තමේන්තු සහ රාජ්‍ය සංස්ථා නියෝජනය කිරීම සඳහා ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් සත් දෙනෙකුට (07) නොවැඩි කැනැත්තන් යම් සංඛ්‍යාවක් කොමසාරිස් ජනරාල් විසින් පත්කරනු ලැබිය යුතුය.එසේ පත්කරනු ලැබූ සාමාජිකයින්ට ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලයේ රැස්වීම්වලදී ඡන්දය දීමේ හිමිකමක් නැත්තේය.

   01. ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බලමණ්ඩලයේ ධූරකාලය වසර තුනක් සඳහා වලංගුවේ.
   02. ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලයට සම්බන්ධීකරණ ලේකම් වරයෙකු පත්කළ යුතුය.

## 07- මහ සභා රැස්වීම් කැඳවීමේ බලය

01. කාරක සභාව විසින් හෝ ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් හෝ ඒ සඳහා බලය පවරන ලද කෙනෙකු විසින් හෝ ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලයේ බලය පවරන ලද කෙනෙකු විසින් හෝ ජාතික ගොවි සංවිධාන බලමණ්ඩලයේ මහා සභාවක් කැඳවීමට බලය ඇත්තේය .
02. ඉහත 01 ට අමතරව සංවිධානයේ කාරක සභා කටයුතු වලට අදාල කරුණු ගැන සාකච්ඡා කිරීම සඳහා සංවිධානයේ කාරක සභා සාමාජික සංඛ්‍යාවෙන් අවම වශයෙන් 1/5ක් ලියවිල්ලකින් මහා සභාවෙන් ඉල්ලා සිටි විට විශේෂ මහා සභා රැස්වීමක් කොමසාරිස් ජනරාල් විසින් කැඳවිය යුතු වන්නේය.
03. ඉහත සඳහන් පරිදි මහා සභාව රැස්වීමක් පැවැත් වීමට ඉල්ලුම් කරන සාමාජිකයින් එම විශේෂ මහා සභා රැස්වීමේදී ඉදිරිපත් කරන්නට අදහස් කරන යෝජනා එම මහා සභා රැස්වීම කැඳවීම සඳහා ඉදිරිපත් කරන ඉල්ලීම සමග ඉදිරිපත් කලයුතු වන්නේය. මෙවැනි ඉල්ලීමක් මත විශේෂ

මහා සභා රැස්වීමක් කැඳවන විට මහා සභාව කැඳවීම පිළිබඳව දැන්වීමෙහි අඩංගු න්‍යාය පත්‍රයට එම යෝජනා ඇතුලත් කලයුතු වන්නේය.

04. මහා සභා රැස්වීමක් සඳහා සාමාජිකයින් හෝ මෙවැනි ඉල්ලීමක් ලැබුණු විට කාරක සභාව මසක් ඇතුලත එම විශේෂ මහා සභා රැස්වීම කැඳවිය යුතු වන්නේය.

## 08- මහා සභා රැස්වීම් කැඳවීමට දැනුම් දීම

01. බල මණ්ඩලයේ ඕනෑම මහා සභා රැස්වීමකට පැමිණීමටත්, එහිදී කතා කිරීමටත් කොමසාරිස් ජනරාල්ටද, ඔහුගෙන් ඒ සඳහා බලය ලත් කෙනෙකුටද බලය ඇත්තේය. තවද සංවිධානයේ ගණන් පරික්ෂණ හෝ වෙනත් පරික්ෂණ සිදුකල නිලධාරින්ටද මහා  සභා රැස්වීම් ගැන දැනුම් දිය යුතු වන්නේය. එවැනි රැස්වීමකට පැමිණීමටත් තමන්ගේ පරික්ෂණ වාර්තාව සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කිරීමටත් එම නිලධාරින්ට බලය ඇති වන්නේය. මීට අමතරව සංවිධානය විසින් ආරාධිත අයට මහා සභා රැස්වීමට සහභාගීවීමට බලය ඇත.

02. වාර්ෂික මහා සභා රැස්වීමක් කැඳවීමේ අදහස යටත්පිරිසෙයින් දින 21කටවත් කලින් සාමාජිකයින්ට දැනුම් දියයුතුය. කරන්නට අදහස් කරන වැඩ ගැන යටත්පිරිසෙයින් දින 7ක්වත් කලින් දැනුම් දිය යුතුය.වාර්ෂික මහා සභා රැස්වීමක් සඳහා වන දැන්වීමක් සමඟ පසුගිය වර්ෂයේ සංවිධානයේ ආදායම් වියදම් ගිණුම හා ශේෂ පත්‍රයද විගණන වාර්තාවේ පිටපතක්ද යැවිය යුතුය.

03. කොමසාරිස් ජනරාල් විසින් හෝ ඔහුගේ බලය පවරනු ලබන කෙනෙකු විසින් හෝ බල මණ්ඩලයේ මහා සභා රැස්වීමක් කැඳවන අවස්ථාවේදී එහි පැමිණීමට බලය ඇති සාමාජිකයින්ට යටත් පිරිසෙයින් පැය 48 ක් වත් කල් ඇතිව ඒ බව දැනුම් දිය යුතුය. රැස්වීම පැවැත්වෙන දිනය වේලාව හා ස්ථානය එම දැන්වීමේ සඳහන් විය යුතුය.

04. යම් සාමාජිකයෙකු මහා සභා රැස්වීමේදී යම් යෝජනාවක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නේ නම්  එම යෝජනාව රැස්වීම පැවැත්වීමේ නියමිත දිනට දින 14 කට කලින් සංවිධානයේ ලේකම් වෙත ලිඛිතව ඉදිරිපත් කලයුතු වන්නේය.

## 09-මහා සභා රැස්වීමකට සහභාගීවීමට බලය ඇති අය

01. බල මණ්ඩලයේ ඕනෑම මහා සභා රැස්වීමකට පැමිණ සිටීමටත් එහිදී කතාකිරීමටත් කොමසාරිස් ජනරාල්ටද, ඔහුගෙන් ඒ සඳහා බලයලත් කෙනෙකුටද බලය ඇති වන්නේය.

02. තවද සංවිධානයේ ගණන් පරික්ෂණ හෝ වෙනත් පරික්ෂණ වාර්තා මහා සභාවට ඉදිරිපත් කරනු ලබන එම ගණන් පරික්ෂණ හෝ වෙනත් පරික්ෂණ සිදුකල නිලධාරින්ටද මහා සභා රැස්වීම ගැන දැනුම් දියයුතු වන්නේය.

03. එවැනි රැස්වීමකට පැමිණීමටත් තමන්ගේ පරික්ෂණ වාර්තාව සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කිරීමටත් එම නිලධාරින්ට බලය ඇතිවන්නේය.මීට අමතර සංවිධානය විසින් ආරාධිත අයට මහා සභා රැස්වීමට සහභාගීවීමට බලය ඇත.

## 10-මූලාසනය

1. මහා සභා රැස්වීමේදී මූලාසනය සභාපති විසින් දැරිය යුතුය. ඔහු පැමිණ නොසිටියහොත් එම අවස්ථාවේදී යෝජනා සම්මතයෙන් තෝරාගත් වෙනත් සාමාජිකයෙකු විසින් රැස්වීමේ මූලාසනය ගත යුතුය.

2.ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් හෝ ඒ සඳහා ඔහුගේ බලය ලත් කෙනෙකු විසින් මහා සභාවක් කැඳවූ අවස්ථාවකදී කොමසාරිස් ජනරාල් හෝ ඒ සඳහා ඔහුගේ බලයලත් කෙනෙකු

මුලාසනය ගත යුතුය. එහෙත් එවැනි අය මුලාසනය දැරුවත් ඔහුට ඡන්දයක් පාවිච්චි කිරීමට බලයක් නොමැත්තේය.

## 11 - මහා සභාවේ තීරණ

1. බලමණ්ඩලයේ ලියාපදිංචි ව්‍යවස්ථා මාලාවේ සංශෝධනයක් සම්මත කරනු ලබන අවස්ථාවකදී හැර අන් සෑම අවස්ථාවකදීම මහා සභාවට ඉදිරිපත් කරන කරුණු හෝ යෝජනා වැඩි දෙනාගේ ඡන්දය අනුව තීරණය කලයුතු වේ. මහා සභාවට ඉදිරිපත්කරන සෑම කරුණක්ම තීරණය වන්නේ ඒ ගැන කරනු ලබන යෝජනා විසිනි. ගණපුරණය ඇති රැස්වීමකට පැමිණ සිටි නියෝජිතයන්ගෙන් 1/2කට වැඩි ප්‍රමාණයක් යම් යෝජනාවකට එකඟව ඡන්දය දුන්විට එය පිළිගත් බවට සලකනු ලැබේ.එහෙත් යම් යෝජනාවකට පක්ෂව හා විපක්ෂවද, ඉදිරිපත් වූ ඡන්ද ගණන එක සමාන වූ විට සභාපති තැනට දෙවැනි හෝ තීරක ඡන්දයක් දීමට බලය ඇත.
2. මහා සභාවට ඉදිරිපත් කරනු ලබන කිසියම් කරුණක් සම්බන්ධව ඡන්ද විමසීමක් අවශ්‍ය වුවහොත් මුලසුන ගත් අය මහා සභාවෙන් විමසා ඡන්දය දීම විවෘතව හෝ රහස් ඡන්ද ක්‍රමයට හෝ කල හැකි වන්නේය.
3. කාරක සභාවට හෝ වෙනයම් නිලයකට පත්කර ගැනීම සඳහා ඡන්ද විමසීමක් පැවැත්විය යුතු වුවහොත් එය රහස් හෝ විවෘත ඡන්දයෙන් කල හැකිවන්නේය.

## 12- මහා සභාවේ බලතල

1. සාමාජිකයන්ගේ සාමාජිකත්වය පිළිගැනීම තහනම් කිරීම, අවලංගු කිරීම හා සංවිධානයෙන් නෙරපා හැරීම.
2. සාමාජිකත්වය තහනම් කිරීමේ කාලය දීර්ඝ කිරීම හෝ එම තහනම වලංගු කිරීම හෝ අවලංගු කිරීම
3. කාරක සභිකයන්ගේ කාරක සභිකත්වය අහෝසි කිරීම හෝ කාරක සභික ධුරය තාවකාලිකව තහනම් කිරීම.
4. ගණන් පරීක්ෂක තැන විසින් සහතික කරන ලද ගණන් වාර්තා සහ ශේෂ පත්‍රයද ගණන් පරීක්ෂණ වාර්තාද ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් සංවිධානයේ කටයුතු විභාග කිරීම සඳහා නිසියාකාරව පත්කරන අයෙකුගේ පරීක්ෂණ වාර්තාද වෙනත් ලියවිලිද සලකා බලා ක්‍රියාකිරීම.
5. කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන සංවිධානයේ ඉදිරි වැඩ සැලසුම් වෙනත් වාර්තා සලකා බැලීමෙන් පසු ඒ සම්බන්ධයෙන් තීරණ ගැනීම.
6. කාරක සභිකයන් අතරින් හෝ සංවිධානයේ සාමාජිකයින් අතරින් තෝරාගත් තිදෙනෙකුගෙන් සමන්විත අනු කමිටු වලට යම්යම් කටයුතු නියම කර ඒවා ක්‍රියාත්මක වීම ගැන සොයා බලා වාර්තා කිරීමට කාරක සභාවට පැවරීම.
7. සංවිධානය විසින් ලබාගත හැකි ණය සීමාව තීරණය කිරීම හා තවද එම ණය ප්‍රමාණය ගතයුතු බවට අවම වශයෙන් මහා සභාවේ 2/3 කැමැත්තෙන් තීරණය වියයුතුය.
8. ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ නිලධාරියාගේ පූර්ව අනුමැතිය ලබා ඉඩම් ,ගොඩනැගිලි සහ යන්ත්‍රෝපකරණ මිළට ගැනීම, විකිණීම, උකස් කිරීම, උකසට ගැනීම, බද්දට ගැනීම, ගොඩනැගිලි ඉදිකිරීම. යන්ත්‍රෝපකරණ සවිකිරීම සහ සුරැකුම්පත් ඇප තැබීම සඳහා අනුමැතිය දීම.

9. ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ අනුමැතියට යටත්ව ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

10. කාරක සභාව විසින් සංවිධානයේ අරමුදල් පරිහරණය කරන ආකාරය සම්බන්ධ කරුණු සොයා බැලීම.

11. බල මණ්ඩලයේ ගිණුම් පවත්වාගෙන යාම සඳහා රාජ්‍ය බැංකුවක ශාඛාවක් තීරණය කිරීම.

12. මහා සභා රැස්වීම් වාර්තා අනුමත කිරීම.

13. සංවිධානයේ කටයුතු කර ගෙන යාමේ පහසුව සඳහා කාරක සභාව විසින් සකස් කරන ලද කාරක සභා නියෝග අනුමත කිරීම.

14. කරනු ලබන ඉල්ලීම අනුව ගොවි සංවිධාන වලට සම්බන්ධ වූ ආයතන වලට තම සංවිධානය වෙනුවෙන් නියෝජිතයින් පත්කර යැවීම.

15. ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ නියමය පරිදි ජාතික කෘෂිකර්ම කමිටුවට නියෝජිතයන් තෝරාපත් කිරීම.

16. බලමණ්ඩලයේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා යම් යම් කාර්යයන් ඉටු කරවා ගැනීමට අවශ්‍ය වන සේවකයෙකු/සේවකයින් පත්කර ගැනීම

17. මෙම ව්‍යවස්ථාව යටතේ හා නීති රෙගුලාසි වලට යටත්ව අවශ්‍ය අවස්ථාවල ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ එම අනුමැතියටද යටත්ව සංවිධානයේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වූද, නැතහොත් එම පරමාර්ථ ඉටුකර ගැනීමට අදාළ හා ආධාර වන්නා වූද, සියළුම කටයුතු කිරීම.

## 13- මහා සභා රැස්වීම් වාර්තා

01.මහා සභා රැස්වීම්වලදී න්‍යාය පත්‍රයේ කරුණක් ගැන තීරණයක් ගත් වහාම ඊළඟ කරුණ ගැන සාකච්ඡා ආරම්භ කිරීමට පෙර,පෙර කී කරුණු ගැන මහ සභාව විසින් ගත් තීරණයේ ලුහුඬු සටහන් වාර්තා පොතේ සඳහන් කර එය මහා සභාව ඉදිරියේ කියවා ඊට සභාපති හා ලේකම් හෝ එදිනට කටයුතු කරනු ලබන නිලධාරීන් දෙදෙනකුගේ අත්සන් තැබිය යුතුය.

## 14- සාමාජික ගාස්තුව

එක් එක් දිස්ත්‍රික් බලමණ්ඩලයකින් රුපියල් 5000/-ක අවම මුදලක් වාර්ෂිකව අය කල යුතුවේ.

## 15-කාරක සභාව

ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලයේ කටයුතු කර ගෙන යෑම සඳහා කාරක සභාවක් තිබිය යුතුය. එම කාරක සභාවේ නිලධාරීන් සංඛ්‍යාව 25ක් විය යුතුය. මහා සභා වේදී එක් දිස්ත්‍රික්කයකින් එක් සාමාජිකයෙකු බැගින් මෙම විසිපස් දෙනා කාරක සභාව සඳහා පත්කර ගත යුතු අතර ඔවුන් අතුරින් පහත තනතුරු සඳහා නිලධාරීන් තෝරාගත යුතුය.

01. සභාපති- කාරක සභාවේ සභාපති විසින් සංවිධානයේ කටයුතු මෙහෙය විය යුතු අතර එහි අභිවෘද්ධිය සම්බන්ධව මූලිකව ක්‍රියා කලයුතුය.

02. උප සභාපති- කාරක සභාවේ සභාපති නැති අවස්ථාවලදී ඔහු වෙනුවෙන් වැඩ බැලීම හා ඔහුට පැවරෙන රාජකාරී කටයුතු කලයුතු වේ.

03. ලේකම් - කාරක සභාවේ වාර්තා පොත් තබාගැනීම සහ කාරක සභාවේ තීරණයන් හෝ මහා සභාවේ සම්බන්ධයෙන් කටයුතු කිරීම හා අවශ්‍ය පරිදි කාරක සභා හෝ මහා සභා රැස්වීම් කැඳවීම කළයුතු වන්නේය.

04. උපලේකම් - ලේකම නොමැති අවස්ථාවලදී ඔහුගේ රාජකාරි කටයුතු කිරීම හා ඔහු සිටින අවස්ථාවලදී ඔහුට සහය දීම උපලේකම් විසින් කලයුතුය.

05. භාණ්ඩාගාරික - බලමණ්ඩලයේ මුදල් වල භාරකාරත්වය හා සංවිධානයෙන් කෙරෙන මුදල් ගණුදෙනු වලට වගකීම,වාර්ෂික මහා සභාවේදී වාර්ෂිකව විගණනය කරන ලද ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීම, සංවිධානයේ ලේඛන හා පොත් පත් පවත්වා ගෙන යාම යනාදිය කලයුතු වන්නේය.

06. කාරක සභිකයින් (20)

07. ඊට අමතරව ගණන් පරීක්ෂකවරුන් තිදෙනෙකු මහා සභාවේදී පත් කර ගත යුතුය- (ඔවුන් ඉහත නිලධාරි මණ්ඩලයට අයත් නොවන අතර ඡන්දය දීමටද බලය නැත්තේය)

08. ප්‍රථම නිලධාරි මඩුල්ල පළමු රැස්වීමේදී තෝරාපත් කරගත යුතුය.

09. කාරක සභාවක් සෑම මාසයකට වරක් පැවැත්විය යුතුය.

10. බල මණ්ඩලය තම කටයුතු නිසි පරිදි ඉටු නොකරන බව හැඟෙන විට මහා සභාව හැර සංවත්සර මහ සභාවක් කැඳවීමේ බලය කොමසාරිස් ජනරාල්ට හෝ ඔහු විසින් බලය පවරන නිලධාරියකුට පැවරේ.

11. තෝරාපත් කරගන්නා ලද කාරක සභිකයන්ගේ නිල කාලය හා බලමණ්ඩලයේ නිලධාරි මණ්ඩලයේ නිල කාලය ඊළඟ සංවත්සරික මහා සභා රැස්වීමේදී අවසන් වේ. එසේ නිල කාලය අවසන් වූ කාරක සභිකයකු මහා සභාවේ තීරණය අනුව අවශ්‍යනම් නැවතත් තෝරාගත හැකිය.

12. තෝරා පත්කර ගන්නා ලද කාරක සභිකයකුගේ මරණයෙන් හෝ ඉල්ලා අස්වීමෙන් හෝ වෙන යම් කරුණකින් හෝ කාරක සභාවේ පුරප්පාඩුවක් ඇති විට ඊළඟට පැවැත්වෙන බලමණ්ඩලයේ මහා සභා රැස්වීමේදී සමිතියේ සාමාජිකයන් අතරින් පුරප්පාඩුව සඳහා කාරක සභිකයන් තෝරා පත්කර ගැනීම කල යුතුය.

## 16- කාරක සභාවේ වගකීම

කාරක සභාව තම බලතල හා යුතුකම් මනාලෙස ඉටුකල යුතු වන්නේය. සෑම විටම නීතියට හා මෙම ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අනුව ඔවුන් විසින් ක්‍රියා කලයුතු වන්නේය.එසේම ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වරයාගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරීන්ගේ උපදෙස් වලට අනුව කටයුතු කලයුතු වන්නේය.

## 17 - කාරක සභාවේ බලකල හා යුතුකම්

නීතියෙන් හා මෙම ව්‍යවස්ථා වලින් කෙරෙන සීමා වලට යටත්ව පහත සඳහන් බලකල හා යුතුකම කාරක සභාව වෙත පැවරී ඇත.

01. බලමණ්ඩලයේ ඉදිරි වැඩ කටයුතු සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම,එය මහා සභාවට ඉදිරිපත් කර අනුමත කර ගැනීම හා ඒවා ක්‍රියාවේ යෙදවීම.
02. මහා සභාවේ අනුමැතියට යටත්ව බලමණ්ඩලයේ කටයුතු සඳහා අවශ්‍ය ඉඩම්, ගොඩනැගිලි යන්ත්‍රෝපකරණ මිලයට ගැනීම, විකිණීම, උකස් කිරීම, උකසට ගැනීම, බද්ද දීම, බද්ද ගැනීම, ගොඩනැගිලි ඉදිකිරීම, යන්ත්‍රෝපකරණ සවි කිරීම

03. බලමණ්ඩලය වෙනුවෙන් ගිවිසුම්වලට ඇතුලත්වීම හා ඒ වෙනුවෙන් අත්සන් තැබීම සඳහා සභාපති තැනට හා ලේකම් තැනට බලය දීම.

04. මහා සභාව විසින් නියම කරන ලද පරිදි හා නියම කරන ලද ප්‍රමාණයන් අනුව ආපසු ගෙවීමේදී ඒ සඳහා කොන්දේසි සකස් කිරීම.

05. ව්‍යවස්ථාවෙන් අවසර ලැබී ඇති පරිදි දිස්ත්‍රික් ගොවි සංවිධාන බල මණ්ඩලවලට ණය හා අත්තිකාරම් ලබා දීම තීරණය කිරීම.

06. ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද ක්‍රියා පිළිවෙළට අනුව හා මහා සභාවේ තීරණය අනුව බලමණ්ඩලයේ කටයුතුවලට අවශ්‍ය සේවකයින් බඳවා ගැනීම, පුහුණු කිරීම හා විනය පාලනය.

07. මහා සභාව විසින් බලමණ්ඩලයේ විවිධ විශේෂ කටයුතු ඉටු කිරීම සඳහා පත් කරන ලද අනුකාරක සභාවල කටයුතු වල ප්‍රගතිය මහා සභාව වෙත දැන්වීම.

08. බලමණ්ඩලයේ අක් මුදල් පරිහරණය කිරීම ගැන මහා සභාවට වගකීම.

09. කාරක සභා නියෝග මාලාව සකස් කිරීම. බලමණ්ඩලයේ ගනුදෙනු ,අලෙවිය, සාමාජික ණය, තැන්පත් ආදිය ගැන නිවැරදි ගිණුම් තබා ගැනීම.

10. බලමණ්ඩලයේ සියළුම වත්කම් වල හා පොත් පත් ලිපි ලේඛන ආදියේ ආරක්ෂාව සැලසීම.

11. සාමාජික ලේඛනයක් නිසි පරිදි තබා ගැනීම.

12. ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්වරයා හෝ ඔහුගේ බලයලත් නිලධාරියෙක් ඉල්ලූ ඕනෑම අවස්ථාවක බලමණ්ඩලයේ පොත් පත් හා ගිණුම් පරීක්ෂා කිරීමට අවශ්‍ය පහසුකම් සැලැස්වීම.

13. බලමණ්ඩලයේ නිලධාරීන් වෙනුවෙන් හා බලමණ්ඩලයේ සාමාජිකයින් වෙනුවෙන් ඔවුන්ගේ සුභ සිද්ධියට අදාළ වන විවිධ පුහුණු කටයුතු සංවිධානය කිරීම හා දැනුම ලබා දීම.

14. මහා සභාව විසින් නියම කරන අනෙකුත් කාර්යයන් ඉටු කිරීම.

## 18- ධූරකාලය හා සාමාජිකත්වය අහෝසි වීම

01. මරණය, ධූරයෙන් ඉල්ලා අස්වීම, ඉවත් කිරීම ,ශ්‍රී ලංකාවෙන් බැහැරවීම, හෝ දැනුම් දීමකින් තොරව කාරක සභා රැස්වීම් තුනකට සහභාගී නොවීම,අසනීප වීම හේතු කොටගෙන ශ්‍රී ලංකාවෙන් බැහැරවීම හෝ අසනීප වීම හේතු කොටගෙන ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලයේ ධූරය අත්හරින ලද අවස්ථාවක ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා වෙනත් තැනැත්තෙකු ඔහුගේ ඉතිරි ධූරකාලය සඳහා පත් කරනු ලැබිය හැකිය.

02. ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩල සෑම සාමාජිකයකු විසින්ම තමා ධූරය අත්හරිනු ලැබුව හොත් මිස අවුරුදු 03ක කාලයක් සඳහා ධූරය දැරිය යුතුය.

03. මිය ගිය, ධූරයෙන් අස්වූ හෝ ඉවත් කරනු ලැබූ සාමාජිකයකු වෙනුවට පත්කරනු ලැබූ තැනැත්තෙකු තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධූරකාලයෙන් ඉකුත් නොවූ කාල පරිච්ඡේදය සඳහා ධූරය දැරිය යුතුය.

04. තවද නොපැමිණි විදේශ ගත වූ හෝ අසනීප වූ සාමාජිකයෙකු වෙනුවෙන් කටයුතු කිරීම සඳහා පත්කරන ලද තැනැත්තෙකු ඒ සාමාජිකයා නොපැමිණෙන හෝ අසනීප වූ කාලපරිච්ඡේදය සඳහා ධූරය දැරිය යුතුය.

05. නියමිත ධූර කාලය අවසන් වීම නිසා ධූරය අවසන් වන වන සෑම සාමාජිකයෙකුම නැවත පත් කිරීම සඳහා සුදුස්සෙකු විය හැකිය.
06. දිස්ත්‍රික් ගොවි සංවිධාන බල මණ්ඩලයේ තනතුරු අහෝසි වීමෙන් ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලයේ ද සාමාජිකත්වය අහෝසි වේ.

## 19- ගණපූර්ණය

.01.මහා සභාව සහ සංවත්සරික මහා සභාව සඳහා අවම සාමාජිකයින් 25 දෙනෙකු සහ ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් පත් කරනු ලබන සාමාජිකයන් අතුරින් 02 ගෙන් සමන්විත විය යුතුය.
02. ඉහත සාමාජිකයින් ප්‍රමාණයට සභාපති, උපසභාපති යන අයගෙන් එක් අයෙකුද, ලේකම්, උපලේකම් යන අයගෙන් එක් අයකු හා භාණ්ඩාගාරික ඇතුලත්විය යුතුය.
03.කාරක සභාව සඳහා අවම වශයෙන් 13 දෙනෙකුවත් සිටිය යුතුය. එයට ඉහත නිලධාරීන්ගෙන් 02 ක් වත් සහභාගී විය යුතු අතර,අවශ්‍ය අවස්ථාවකදී කොමසාරිස් ජනරාල් විසින් පත් කරනු ලබන නිලධාරීන්ට හෝ වෙනත් අදාළ වන නිලධාරීන්ට ආරාධනා කල හැක.

## 20- සාමාජික ලේඛනය

01. සාමාජිකයින්ගේ තොරතුරු ලේඛනයක් ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලය විසින් තබා ගතයුතු අතර එම ලේඛනයේ එම සාමාජිකයින් නියෝජනය වන දිස්ත්‍රික්කය ගොවි සංවිධාන වල නම්, ලියාපදිංචි අංක , එම සංවිධාන වල ක්‍රියාකාරකම් හා වත්කම් ආදී විස්තර ඇතුලත් කල යුතුය. එය වාර්ෂිකව යාවත්කාලීන කළ යුතුය.

02. සාමාජිකයෙකුගේ මරණින් පසු හෝ සාමාජිකත්වයට නියමිත කාලසීමාව අවසන් වූ පසු ඒ ඒ අදාළ දිස්ත්‍රික්ක ගොවි සංවිධාන බල මණ්ඩලවලය විසින් එම සාමාජිකත්ව හිමිකම ලැබිය යුතු තැනැත්තා නම් කලයුතුය.

## 21- සාමාජිකයන්ගේ අයිතිවාසිකම් හා යුතුකම්

01.මෙම ව්‍යවස්ථාවේ අංක 09 යටතේ ඇතුලත් කරගන්නා සාමාජිකයින්ට මෙම ව්‍යවස්ථාවේ සඳහන් සියළුම අයිතිවාසිකම් ,යුතුකම් හා වගකීම් ඇත.
02.සෑම සාමාජිකයෙක්ම සංවිධානයේ කාරක සභා නියෝගවල අඩංගු කොන්දේසි පිළිපැදීමට එකඟ වියයුතුය.

## 22-හිමිකම් වෙනස්වීම

සාමාජිකයෙකුගේ මරණින් පසු හෝ සාමාජිකත්වයට නියමිත කාල සීමාව අවසන් වූ පසු ඒ ඒ අදාළ දිස්ත්‍රික් ගොවි සංවිධාන බල මණ්ඩලය විසින් ඊළඟට එම සාමාජිකත්ව හිමිකම ලැබිය යුතු තැනැත්තා මාස 03 ක් ඇතුලත නම් කල යුතුය. එසේ නොකලහොත් නව සාමාජිකයින් නම් කිරීමේ බලය ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත හිමි වේ.

## 23-සාමාජිකත්වය අහෝසිවීම

01.පහත සඳහන් කරුණු නිසා හෝ කරුණක් නිසා සාමාජිකත්වය අහෝසි වන්නේය.
a. මරණය / සිහිවිකල් බව /පූර්ණ බෙලහීනතාවය
b. මසකට කලින් ලිඛිතව දැනුම් දී සංවිධානයෙන් ඉල්ලා අස්වීම.

c. ව්‍යවස්ථාවේ අංක 14 යටතේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් නොමැතිවීම.
d. සාමාජිකත්වය අවලංගු කිරීම හෝ සාමාජිකත්වයෙන් නෙරපීම.
e. තමා නියෝජනය කරන ගොවිජන සේවා කාරක සභාවේ /සංවර්ධන සභාවේ සාමාජිකත්වය අහෝසි වූ විට දිස්ත්‍රික් බල මණ්ඩලයට දැනුම් දී, නව සාමාජිකයන් ලබා ගැනීම.

## 24-සාමාජිකත්වය අවලංගුකිරීම හා සාමාජිකත්වයෙන් නෙරපා දැමීම.

01. යම්කිසි සාමාජිකයෙකු මෙම ව්‍යවස්ථාව කඩ කලහොත් හෝ සාධාරණ හේතුවක් නොමැතිව නොකඩවා මහා සභා රැස්වීම් දෙකකට නොපැමිණිය හොත් ඔහුගේ සාමාජිකත්වය කාරක සභාව විසින් තහනම් කර ඒ බව මහා සභාවට පැමිණිලි කලයුතු වේ. එවැනි අවස්ථාවල මහා සභාවේ තීරණයක් අනුව, එම සාමාජිකයින්ගේ සාමාජිකත්වය අවලංගු කිරීම කල යුතුය.

02. තවද, යම් සාමාජිකයෙකු සංවිධානයේ කටයුතු වලට හා ප්‍රතිපත්ති වලට හානි වන පරිදි හෝ බාධා වන පරිදි කටයුතු කලහොත් එසේම සංවිධානයේ ගරුත්වයට හානි වන අයුරින් කටයුතු කලහොත් ඉහත (01) පරිදිම එම සාමාජිකයා සංවිධානයෙන් නෙරපා දැමිය හැකිය. එබැවින් නෙරපා දැමීමද මහා සභාවකින් සම්මත වියයුතුය.

03. කෙසේ වුවද යම්කිසි අවස්ථාවකදී ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලයේ සාමාජිකයෙකු සංවිධානයේ ගරුත්වයට හානි වන අයුරින් කටයුතු කලහොත් හෝ සංවිධානයේ, ප්‍රතිපත්ති හා කාරක සභා නියෝග උල්ලංඝනය කලහොත් හෝ වෙනත් විෂමාචාර වැරදි සහගත ක්‍රියාවන් කලහොත් හෝ ඔහු සාමාජිකත්වයෙන් නෙරපා හැර ඒ වෙනුවට වෙනත් සාමාජිකයෙකු නම් කිරීමට දිස්ත්‍රික් බල මණ්ඩලය දැන් වූ විට, නව සාමාජිකයෙකු පත් කිරීමට ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ට බලය ඇත.

## 25 - බල මණ්ඩලයේ අරමුදල

01.ව්‍යවස්ථාවේ අංක 12 අනුව බලමණ්ඩලයේ අරමුදල් කාරක සභාවේ අනුමැතිය ඇතිව බලමණ්ඩලයේ සාමාජිකයින්ගේ යහපත හා සංවිධානයේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා යෙදවිය හැකි වන්නේය.

02.බැංකු ගිණුම් පවත්වාගෙන යාම, බැංකු ගණුදෙණු වලදී චෙක්පත් අත්සන් කිරීම හා ඒ සම්බන්ධ කටයුතු සඳහා භාණ්ඩාගාරික වෙත හා සභාපති හෝ ලේකම් යන දෙදෙනාගෙන් එක් අයකු වෙත බලය පැවරේ.

03.ජාතික ගොවි සංවිධාන බලමණ්ඩලයේ අරමුදල් පහත ආකාරයෙන් සංයුක්ත විය හැකිය.

a. දිස්ත්‍රික් ගොවි සංවිධාන බලමණ්ඩලයෙන් ලැබෙන සාමාජික මුදල්
b. රජයේ හෝ රජයේ පිළිගත් වෙනත් ආයතන වලින් හෝ පුද්ගලික සමාගම්, පුද්ගලික ආයතන ,රජයේ නොවන විවිධ සංවිධාන විදේශීය ආධාර යටතේ ලැබෙන පරිත්‍යාග හෝ ආධාර මුදල්
c. සංවිධානයේ තැන්පත් මුදල්
d. ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වරයා විසින් බල මණ්ඩලයට ලබා ගත හැකි බවට අනුමැතිය දෙන ලද පරිත්‍යාග හෝ මුදල්.

e. සාමාජික අරමුදල් වාර්ෂික මහා සභා රැස්වීමේදී හෝ විශේෂ මහා සභා රැස්වීමේ හෝ තීරණය කරන ලද පරිදි මාසිකව හෝ ත්‍රෛමාසිකව හා වාර්ෂිකව එක් දිස්ත්‍රික් බලමණ්ඩලයකින් අයකර ගන්නා සාමාජික මුදල්

f. සාමාජිකයන්ගෙන්,මහජනතාවගෙන් හෝ සංවිධානයට ලැබෙන පරිත්‍යාග

g. කොන්ත්‍රාත්, ව්‍යාපාර ආදියෙන් ලැබෙන ලාභාංශ සහ ගොවිජන සංවර්ධන අරමුදලෙන් ලැබෙන මුදල්

## 26. ජාතික ගොවි සංවිධාන බලමණ්ඩලයේ අරමුදල් පරිහරණය

a. චෙක්පත් නිකුත් කිරීමේදී එහි සභාපති හෝ ලේකම් සහ භාණ්ඩාගාරි අත්සනින් යුතු අතර කොමසාරිස් ජනරාල් හෝ ඔහු විසින් බලය පවරන වෙන නිලධාරියෙකු විසින් රු.25,000 ට වැඩි වටිනාකමින් යුත් චෙක්පත් නිර්දේශ ක යුතුය.

b. රාජ්‍ය බැංකුවක ඉතිරි කිරීමේ සහ ජංගම ගිණුමක් ආරම්භ කිරීම ඇ පවත්වාගෙනයාම කළ යුතුය. රාජ්‍ය බැංකුව තීරණය කිරීමේ බලය මහා සභා සතු වේ.

c. ලැබෙන සියළුම මුදල් ඉතිරි කිරීමේ ගිණුමේ තැන්පත් කළයුතු අතර,වියද කිරීමට අවශ්‍ය වන මුදල් අවශ්‍යතාවය සඳහා ජංගම ගිණුමට මාරු කළ යුතුය.ෆ සඳහා සභාපති,ලේකම් සහ භාණ්ඩාගාරිකගේ අනුමැතිය අවශ්‍යය.

d. උපරිම රු.15,000/- අත ඉතිරියක් රඳවා ගත හැක.

e. සියළුම මුදල් වියදම් කාරක සභාවේ අනුමැතියට යටත්ය.

## 27 - බල මණ්ඩලයේ ගිණුම

01.බලමණ්ඩලය මගින් ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයා අතින් අනුමත කරා ලද නිලධාරියෙකු හෝ ආයතනයක් ලවා ගොවි සංවිධානයේ ගිණුම් වාර්ෂිකව පරීක්ෂාකර ගා යුතුය.

02.ගිණුම් පරීක්ෂණ නිලධාරී විසින් බලමණ්ඩලයේ පරීක්ෂා කරන ලද ගිණුම් වාර්තාවේ එ පිටපතක් ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයාට හෝ මෙම කාර්යය සම්බන්ධයෙ කටයුතු කිරීම සඳහා ඔහු විසින් බලය පවරනු ලැබූ නිලධාරියාට යැවිය යුතුවේ.

03. වාර්ෂික ගිණුම් පරීක්ෂණ වාර්තා යම් සාමාජිකයෙකුගේ දැන ගැනීම සඳහා කාරක සභාෙ ලේකම්ගෙන් හෝ සභාපතිගෙන් ඉල්ලා සිටි අවස්ථාවකදී වාර්තාවේ පිටපතක් කාරක සභාෙ ලේකම් විසින් සාමාජිකයින්ට ලබාදිය යුතු වේ.

04. මුදල් වර්ෂය අවසන්ව ඊළඟට කැඳවන මහා සභා රැස්වීමට ඉකුත් වර්ෂයේ ගිණුම් කටයු පිළිබඳ ලිඛිත වාර්තාවක් කාරක සභාවේ භාණ්ඩාගාරික විසින් ඉදිරිපත් කල යුතුය. එ වාර්තාවටම ගිණුම් පරීක්ෂක ගේ වාර්තාව ද ඇතුලත් කල යුතුය. භාණ්ඩාගාරික විසින් සක කරන ලද ගිණුම් වාර්තාව වාර්ෂික මහා සභාවට ඉදිරිපත් කර එය අනුමත කරවා ගැනීම කාරා සභාවේ වගකීමකි.

05. ගිණුම් කටයුතු සම්බන්ධයෙන් ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් හෝ ඔ විසින් බලය පවරනු ලැබූ නිලධාරියකු විසින් දෙනු ලබන උපදෙස් වලට අනුව කටයුතු කිරීම කාරක සභාව බැඳී සිටී.

06. නීතියට හා බල මණ්ඩලයේ නියෝග වලට අනුකූලව ගිණුම් පවත්වාගෙන යා යුතුය.

07. බල මණ්ඩල ගිණුම විගණනය කිරීමේ බලය කොමසාරිස් ජනරාල් හෝ ඔහු විසින් බලය පවරන නිලධාරියකු සතුය.

## 28-මුදල් වර්ෂය

බලමණ්ඩලයේ මුදල් වර්ෂය සෑම අවුරුද්දකම ජනවාරි මාසයේ 01 දින සිට දෙසැම්බර් මස 31 දින දක්වා වේ. තව කාරක සභාවේ ඉල්ලීම පරිදි කාර්තුවකට හෝ කිහිපයකට ගිණුම් වාර්තා සකස් කර ඊළඟ මහා සභා රැස්වීමට ඉදිරිපත් කළ හැකිය.

## 29- ව්‍යවස්ථා සංශෝධනය

ජාතික බල මණ්ඩලයේ මහා සභාවක සම්පූර්ණ සාමාජික සංඛ්‍යාවෙන් 2/3 ගේ ඡන්දය ඇතිව පමණක් මෙම බල මණ්ඩලයේ ව්‍යවස්ථාව සංශෝධනය කර ගත හැකි වන්නේය. එසේ කරනු ලබන සංශෝධන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය ලැබීමෙන් අනතුරුව ක්‍රියාත්මක කල හැකි වන්නේය.

*මෙහි බලමණ්ඩලය යනුවෙන් නම්කරන ලද්දේ ශ්‍රී ලංකා ජාතික, ගොවි සංවිධාන බලමණ්ඩලයයි.

එස්. එම්. [illegible]
ගරු සභාපති
ශ්‍රී [illegible] ගොවිසංවිධාන ජාතික [illegible]ය
අංක 120 [illegible]
මෙගොඩවැව, අනුරාධපුර

ජේ. ආර්. [illegible]
ගරු ලේකම්
ශ්‍රී ලංකා ගොවිසංවිධාන ජාතික බලමණ්ඩලය
අංක: 70/9, විහාර මාවත,
[illegible],
හම්බන්තොට,

එස්. එම්. බී. බී. සමරසේකර
කොමසාරිස් (සේවා)
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
අංක. 42, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
තැ.පෙ. 537, කොළඹ 07.

ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

# 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත

[සහතිකය සටහන් කළේ 2000 අගෝස්තු මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

2000 අගෝස්තු මස 18 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

## V වන කොටස

### ගොවි සංවිධානවල ආයතනික ව්‍යුහය

ගොවි සංවිධාන පිහිටුවීම.

**43.** (1) කොමසාරිස් ජනරාල් විසින් නිශ්චය කරනු ලබන යම් ප්‍රදේශයක් සඳහා ගොවි සංවිධාන එකක් හෝ වැඩි ගණනක් පිහිටුවනු ලැබිය හැකි අතර, ඒවායේ සාමාජිකයන් වීමට සුදුසුකම් ලත් තැනැත්තන්ගෙන් ඒ ගොවි සංවිධාන සමන්විත විය යුතු ය.

(2) ගොවි සංවිධානයක් විසින් ලියාපදිංචි කිරීම සඳහා තමා වෙත ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක, කොමසාරිස් ජනරාල් විසින් ඒ ගොවි සංවිධානය ලියාපදිංචි කරනු ලැබිය යුතු ය. ලියාපදිංචි කරනු ලැබූ විට, කොමසාරිස් ජනරාල් විසින් ඒ ගොවි සංවිධානයට අංකයක් නියම කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද, වාරිමාර්ග යෝජනා ක්‍රමයක් යටතේ වූ යම් ප්‍රදේශයක් සඳහා හෝ රාජ්‍ය සංස්ථාවක බල ප්‍රදේශයක් යටතට පත් වන යම් ප්‍රදේශයක් සඳහා හෝ කොමසාරිස් ජනරාල් විසින් ගොවි සංවිධානයක් ලියාපදිංචි කිරීම, අවස්ථාවෝචිත පරිදි වාරිමාර්ග කටයුතු හෝ ඒ රාජ්‍ය සංස්ථාව භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්ගේ එකඟත්වය ඇතිව හැර කරනු නොලැබිය යුතු ය.

(3) ලියාපදිංචි කරනු ලැබූ සෑම ගොවි සංවිධානයක් ම අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, සංස්ථා නාමයෙන්, එය විසින් නඩු පැවරීම සහ එයට විරුද්ධව නඩු පවරනු ලැබීම කළ හැකි ය.

(4) කෘෂිකර්මය තම ජීවිකාව කර ගත් සෑම තැනැත්තකු ම, තමා-

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් නම් ;

(ආ) වයස අවුරුදු දහසයට නොඅඩු නම් ; සහ

ගොවි සංවිධානයක් අපොහොසත්වන අවස්ථාවක, ඒ රැස්වීම කැඳවීමේ බලය ඒ ප්‍රදේශයේ ගොවිජන සංවර්ධන සභාවට තිබිය යුතු ය.

(10) ගොවි සංවිධානයක කමිටුව තෝරා පත් කර ගනු ලබන ආකාරය, එහි සාමාජිකයන්ගේ ධූර කාල, ගොවි සංවිධානයේ රැස්වීම්වල කටයුතු කිරීම, කමිටු සාමාජිකයන් ඉවත් කිරීම හා ඉල්ලා අස් වීම, ගොවි සංවිධානයක කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීම, ගොවි සංවිධානයේ රැස්වීමක ගණපූරණය, ගොවි සංවිධානයක සාමාජිකයන් බඳවා ගැනීම, සාමාජික ගාස්තු අය කර ගැනීම, ඉඩම් හිමි ගොවීන්ගේ හා බුක්තිකරුවන්ගේ හෝ සාමාජිකයන්ගේ රැස්වීම් කැඳවීම සහ ඒ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය දක්වමින් නියෝග සාදනු ලැබිය හැකි ය.

ගොවි සංවිධානවල ගිණුම් කොමසාරිස් ජනරාල් විසින් පරීක්ෂා කරනු ලැබිය හැකි බව.

44. (1) කොමසාරිස් ජනරාල් හෝ ඒ සඳහා සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය දෙන ලද නියෝජිතයකු සෑම ගොවි සංවිධානයක ම ගිණුම් පරීක්ෂා කිරීමට හිමිකම ලැබිය යුතු ය.

(2) ගොවි සංවිධානයක අරමුදල් නියමිත බැංකුවක ගිණුම්වල තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) ගොවි සංවිධානයක ගිණුම් පවත්වා ගෙන යා යුතු ආකාරය සහ ඒ ගිණුම් පවත්වා ගෙන යාම සඳහා වගකිව යුතු තැනැත්තන් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

ණය පහසුකම් ලබා ගැනීමේ බලය ගොවි සංවිධානවලට තිබිය යුතු බව.

45. (1) සෑම ගොවි සංවිධානයක් විසින් -

(අ) නියමිත බැංකු හෝ රාජ්‍ය ආයතනවලින් ණය හෝ අත්තිකාරම් ලබා ගැනීම ;

(ආ) නියමිත කාල පරිච්ඡේදයක් ඇතුළත ණය ආපසු අය කර ගැනීමේ හා ආපසු ගෙවීමේ පදනම මත හවුල් ණය යෝජනාක්‍රම යටතේ තම සාමාජිකයන් සඳහා නියමිත බැංකුවලින් හෝ ණය ආයතනවලින් ණය ලබා ගැනීම ;

(ඇ) යම් වංවල හෝ නිශ්වල දේපළක් අත් කර ගැනීම, දැරීම, බද්දට ගැනීම හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම හෝ ඔඩපනය කිරීම ;

(ඈ) ගොවි සංවිධානයක මුදල්, එහි කාර්ය කිරීමෙහි ලා ප්‍රයෝජනයට ගැනීම ;

(ඉ) ස්වකීය සාමාජිකයන් වෙත ණය දීම සඳහා ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී මුදල් ප්‍රයෝජනයට ගැනීම,

කරනු ලැබිය හැකි ය.

(2) ගොවි සංවිධානයක් විසින් තම සාමාජිකයන්ගෙන් තැන්පතු ලබා ගෙන, තම සාමාජිකයන් වෙත ණය දීම සඳහා ඒ තැන්පතු ප්‍රයෝජනයට ගනු ලැබිය හැකි ය.

(3) ගොවි සංවිධානයක සාමාජිකයකු විසින්, සංවිධානයේ තැන්පත් කරන ලද මුදල් කිසිවක් ආපසු ලබා ගැනීමට තමා අදහස් කරන බවට දින දාහතරක දැනුම් දීමක් සංවිධානය වෙත ලැබූ විටෙක ගොවි සංවිධානය විසින් ඒ සාමාජිකයා වෙත එසේ තැන්පත් කරන ලද මුදල්, ඊට අයත් පොළිය ද සමග ගෙවනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තිය මගින් පැවරුණු බලතල ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ආකාරය නියම කෙරෙමින් නියෝග සාදනු ලැබිය හැකි ය.

46. කුඩා ගොවි කණ්ඩායම් විසින් කර ගෙන යනු ලබන කෘෂිකාර්මික කටයුතු හෝ ඔවුන් අතර පවත්නා සම්බන්ධතා සැලකිල්ලට ගනිමින්, ඔවුනට එක්ව සංවිධානය වීමට ඔවුන් ධෛර්යමත් කිරීම ගොවි සංවිධානයක කාර්ය වන්නේ ය. කුඩා ගොවි කණ්ඩායම්.

47. ගොවිජන සංවර්ධන සභා බල ප්‍රදේශයක පිහිටුවන ලද සෑම ලියාපදිංචි කරන ලද ගොවි සංවිධානයක් විසින් ම, ඒ ප්‍රදේශය සඳහා පිහිටුවන ලද ගොවිජන සංවර්ධන සභාවක ස්වකීය සාමාජිකත්වය නියෝජනය කිරීම සඳහා නියෝජිතයකු හෝ නියෝජිතයන් තෝරා පත් කරනු ලැබිය යුතු ය. ගොවි සංවිධානයක් විසින් ගොවිජන සංවර්ධන සභාවට සාමාජිකයකු පත් කළ යුතු බව.

48. සෑම ගොවි සංවිධානයක් විසින් ම ගොවිජන සංවර්ධන සභාවට පහත සඳහන් ආකාරයෙන් සහාය විය යුතු ය :– ගොවි සංවිධානය ගොවිජන සංවර්ධන සභාවට සහාය විය යුතු බව.

(අ) ස්වකීය බල ප්‍රදේශය ඇතුළත කෘෂිකාර්මික ඉඩම්වල ඉඩම් හිමි ගොවීන් සහ භුක්තිකරුවන් මේ පනතේ විධිවිධානවලට අනුකූලව ස්වකීය කෘෂිකාර්මික ඉඩම් වගා කිරීමට පෙළඹවීමෙන් සහ එක් එක් කන්නය

සඳහා කුඹුරු ඉඩම් වගා කිරීම සඳහා වැඩ සටහ
සකස් කිරීමෙන්, සහ ගොඩබිම් වගා කිරීම සඳහ
වාර්ෂික වැඩ සටහන් සකස් කිරීමෙන් ;

(ආ) ස්වකීය බල ප්‍රදේශය ඇතුළත සතුටුදායක ලෙ
වගා කරනු නොලබන කෘෂිකාර්මික ඉඩම් පිළිබ
තොරතුරු එකතු කිරීමෙන් හා වාර්තා ඉදිරිපත
කිරීමෙන් ;

(ඇ) ස්වකීය බල ප්‍රදේශය තුළ කෘෂිකාර්මික ඉඩම්, කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ සහ කෘෂිකාර්මික සත්ත්වයන් පිළිබඳ දත්ත එකතු කිරීමෙන් හා ඒ දත්ත ගොවිජන සංවර්ධන සභාවට සැපයීමෙන් ;

(ඈ) ස්වකීය බල ප්‍රදේශය ඇතුළත පස සංරක්ෂණය, කාර්යක්ෂම ජල පරිහරණය, කොම්පෝස්ට් පොහොර භාවිතය ධෛර්යමත් කිරීමෙන් හා ඒ ප්‍රදේශය සඳහා නිර්දේශිත කෘෂිකාර්මික භෝග වගාව නිර්දේශ කිරීමෙන් සහ ඒ ප්‍රදේශය සඳහා ඉතාමත් ම සුදුසු ඇති කරන සතුන් වර්ග බෝ කිරීමෙන් හෝ මිරිදිය මත්ස්‍යයන් වගාකිරීමෙන් ;

(ඉ) එම බෝග හා සතුන් හෝ මිරිදිය මත්ස්‍යයන් රෝගවලින් හා වසංගතවලින් මිදී ඇති බවට වග බලා ගැනීම සඳහා පියවර ගැනීමෙන් ;

(ඊ) ස්වකීය බල ප්‍රදේශය තුළ ඉඩම් හිමි ගොවීන්ට, බුක්තිකරුවන්ට හා කෘෂිකාර්මිකයන්ට දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමෙන් හා පාරිසරික වශයෙන් හිතකර ක්‍රම යොදා ගැනීම සඳහා ඔවුන් ධෛර්යමත් කිරීමෙන්.

ගොවි සංවිධාන විසින් ගොවිජන සංවර්ධන සභාවට ඉඩම්හිමි ගොවීන්ගේ හා බුක්තිකරුවන්ගේ තොරතුරු ඉදිරිපත් කළ යුතු බව.

**49.** (1) සෑම ලියාපදිංචි ගොවි සංවිධානයක් විසින් ම, ස්වකීය බල ප්‍රදේශය තුළ කෘෂිකාර්මික ඉඩම්වල අයිතිකාර ඉඩම් හිමි ගොවීන්ගේ හා බුක්තිකරුවන්ගේ තොරතුරු ගොවිජන සංවර්ධන සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) ලියාපදිංචි ගොවි සංවිධානයක් විසින් කෘෂිකර්මයට අදාළ භාණ්ඩ හා සේවා සැපයීමෙහි නිරත වීම නීත්‍යනුකූල වන්නේ ය.

50. (1) ගොවි සංවිධානයක් ලියාපදිංචි කිරීම අවලංගු කිරීම සහ එහි කටයුතු ගණන් බේරා වසාදැමීම සඳහා ඈවරකරුවකු හෝ ඈවරකරුවන් පත් කිරීම :–

(අ) ඒ ගොවි සංවිධානයේ සාමාජික සංඛ්‍යාව විසි පහකට අඩු වේ නම් ;

(ආ) ගොවි සංවිධානය ලියාපදිංචි කිරීමේ දින පටන් එක් අවුරුද්දක් ඉක්මවන කාල පරිච්ඡේදයක් එය ක්‍රියාත්මක නොවී ඇත්නම් ; හෝ

(ඇ) ගොවි සංවිධානයේ පරමාර්ථවලට පටහැනිව ගොවි සංවිධානය කටයුතු කර ඇති බව හෝ එහි සාමාජිකයන්ගේ සුභ සාධනය සඳහා කටයුතු කිරීමට අපොහොසත් වී ඇති බව ප්‍රකාශ කරමින් ඒ ගොවි සංවිධානයේ සාමාජික සංඛ්‍යාවෙන් හතරෙන් එකකට නොඅඩු සංඛ්‍යාවක් විසින්, කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉල්ලීමක් කරනු ලබන්නේ නම්,

කොමසාරිස් ජනරාල්වරයා විසින් කරනු ලැබිය හැකි ය.

(2) එම අවලංගු කිරීම පිළිබඳ නිවේදනය, පිළිවෙලින් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සංසරණය වන ප්‍රවෘත්ති පත්‍රයක පළ කරනු ලැබිය යුතු ය.

(3) සංවිධානයේ කටයුතු ගණන් බේරා වසා දැමීම සඳහා පත් කරන ලද ඈවරකරුවාට හෝ ඈවරකරුවන්ට–

(අ) සංවිධානයේ ණය හිමියන් අතර ප්‍රමුඛතාව අදාළ යම් ප්‍රශ්නයක් තීරණය කිරීමේ ;

(ආ) සංවිධානයේ දේපළ විකිණීමේ ;

(ඇ) කොමසාරිස් ජනරාල්වරයාගේ පූර්ව අනුමැතිය ඇතිව, සංවිධානය විසින් හෝ ඊට එරෙහිව හිමිකම් පෑම් කිසිවක් සමථයකට පත් කිරීමේ ;

(ඈ) සංවිධානයේ වත්කම් නියමිත ආකාරයෙන් බෙදා හැරීම සඳහා කටයුතු කිරීමේ

බලය ඇත්තේ ය.

(4) සංවිධානය ඈවර කිරීමේ දී එහි අරමුදල ඈවර කිරීමේ වියදම පියවීම සඳහා ප්‍රථමයෙන් යෙදවිය යුතු අතර, ඉක්බිතිව, එහි බැරකම්වලින් නිදහස් වීම සඳහා යෙදවිය යුතු ය. ඈවර කිරීම නිම කිරීමෙන් පසුව, ඉතිරි වන යම් අතිරික්තයක් ගොවිජන සංවර්ධන අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(අ) යම් වංචල හෝ නිශ්චල දේපළක් අත් කර ගැනීමේ, බද්දට හෝ කුලියට ගැනීමේ හෝ උකස් කිරීමේ, ඔඩපනය කිරීමේ, විකිණීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ :

(ආ) ගොවි ජනතා සමාගම් පිහිටුවීමේ ;

(ඇ) ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලය වෙත ආණ්ඩුවේ කෘෂිකාර්මික ප්‍රතිපත්ති සම්බන්ධයෙන් යෝජනා හා අදහස් ඉදිරිපත් කිරීමේ ;

(ඈ) ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලයට නියෝජිතයන් තිදෙනකු තෝරා පත් කර ගැනීමේ

බලය ඇත්තේ ය.

සාමාජික ගාස්තු ආදිය.

62. සෑම ගොවි සංවිධාන දිස්ත්‍රික් බලමණ්ඩලයක් විසින් ම–

(අ) තම කටයුතු සඳහා දිස්ත්‍රික්කය ඇතුළත සියලු ගොවි සංවිධානවලින් සාමාජික ගාස්තු එකතු කිරීම ;

(ආ) තම කටයුතු කරගෙන යාම සඳහා ණය මගින් හෝ අන්‍යාකාරයකින් ආධාර ලබාගැනීම ;

(ඇ) නියමිත බැංකුවක ගිණුමක් පවත්වාගෙන යාම ;

(ඈ) බලමණ්ඩලයේ ආදායම හා වියදම පිළිබඳ ගිණුම් පවත්වාගෙන යාමට භාණ්ඩාගාරිකට නියම කිරීම

කරනු ලැබිය හැකි ය.

ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලයක ගිණුම් පවත්වාගෙන යාම.

63. (1) සෑම ගොවිජන සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලයක් විසින් ම, එහි ගිණුම් කොමසාරිස් ජනරාල් විසින් නියම කරනු ලැබූ ආකාරයට පවත්වාගෙන යනු ලැබිය යුතු ය. කොමසාරිස් ජනරාල්වරයා, එවැනි ගිණුම් විගණනය කිරීම සඳහා කටයුතු කළ යුතුය.

(2) ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලයක පොත් සහ ගිණුම් කොමසාරිස් ජනරාල් විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකු විසින් පරීක්ෂා කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තියේ කාර්ය සඳහා ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලයක් විසින් අවශ්‍ය සියලු පොත්, ලේඛන සහ ගිණුම් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, (2) වන උපවගන්තියේ සඳහන් පරීක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය විය හැකි යම්තාක් වූ සියලු සහාය ද ලබා දිය යුතු ය.

**ගොවි සංවිධාන පළාත් බල මණ්ඩල පිහිටුවීම.**

**64.** (1) පළාතක ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලයක් විසින් ඒ පළාත සඳහා පළාත් බල මණ්ඩලයක් පිහිටුවනු ලැබිය හැකි ය.

(2) ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලය පිළිබඳ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ගොවි සංවිධාන පළාත් ඒකාබද්ධ සංගමයට අදාළ විය යුතු ය.

**ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලය පිහිටුවීම.**

**65.** (1) දිවයිනේ ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලයක් පිහිටුවනු ලැබිය හැකි ය. ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලය කොමසාරිස් ජනරාල් විසින් ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(2) ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලය එක් එක් නියෝජිතයා සෑම ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලයකින් ම තෝරා පත් කර ගනු ලැබූ නියෝජිතයන් තිදෙනකු බැගින් නියෝජනය විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලය ලියාපදිංචි කිරීමේ දින පටන් සහ ඉන් පසුව, එම බලමණ්ඩලය අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, (1) වන උපවගන්තිය මගින් එයට පවරා ඇති නාමයෙන් නඩු පැවරීම හා එයට විරුද්ධව නඩු පවරනු ලැබීම කළ හැකි විය යුතු ය.

(4) ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලය ස්වකීය කාර්යාලය කොළඹ නගරය තුළ පවත්වාගෙන යා යුතු ය.

(5) ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලයේ ක්‍රියාවක් හෝ නඩු කටයුත්තක්, එහි සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවතීමේ හේතුව නිසාම පමණක් නිර්බල වූ ලෙස සලකනු නොලැබිය යුතු ය.

(6) ආණ්ඩුවේ දෙපාර්තමේන්තු සහ රාජ්‍ය සංස්ථා නියෝජනය කිරීම සඳහා ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් පස් දෙනකුට නොවැඩි තැනැත්තන් යම් සංඛ්‍යාවක් කොමසාරිස් ජනරාල් විසින් පත් කරනු ලැබිය යුතු ය. එසේ පත් කරනු ලැබූ සාමාජිකයන්ට ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලයේ රැස්වීම්වල දී ඡන්දය දීමේ හිමිකමක් නැත්තේ ය.

(7) කොමසාරිස් ජනරාල් විසින් ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලයට සම්බන්ධීකරණ ලේකම්වරයකු පත් කරනු ලැබිය යුතු ය.

(8) බල මණ්ඩලයේ සාමාජිකයන්ගේ ධුර කාලය ඒ සාමාජිකයන් විසින් ධුරය අත් හැරීම, බල මණ්ඩලයේ කාර්ය මණ්ඩලය පත් කිරීම සහ බල මණ්ඩලයේ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලය විසින් සාමාජික ගාස්තු ආදිය ලබාගත හැකි බව.

66. ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලය විසින් -

(අ) ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලවලින් සාමාජික ගාස්තු අය කර ගනු ලැබිය හැකි ය ;

(ආ) රජයෙන් හෝ රාජ්‍ය සංස්ථාවලින් හෝ ආණ්ඩුවේ නොවන සංවිධානවලින් මූල්‍යාධාර හෝ ද්‍රව්‍යාධාර ලබාගත හැකි ය ;

(ඇ) නියමිත බැංකුවක ගිණුම් පවත්වා ගෙන යා හැකි ය ;

(ඈ) නිසි ගිණුම් පොත් පවත්වා ගෙන යා හැකි ය ;

(ඉ) එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා එහි අරමුදල් වැය කරනු ලැබිය හැකි ය.

ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලයේ බලතල හා කර්තව්‍ය.

67. (1) ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බලමණ්ඩලය විසින් ආණ්ඩුවේ කෘෂිකාර්මික ප්‍රතිපත්ති සමාලෝචනය කරනු ලැබිය යුතු අතර, ඒ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහි ලා සහාය දිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල ව්‍යාප්තියට හානියක් නොමැතිව -

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත් කර ගැනීමේ, දැරීමේ, බද්දට හෝ කුලියට ගැනීමේ හෝ දීමේ උකස් කිරීමේ, ඔඩපනය කිරීමේ, විකිණීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ ;

(ආ) ලියාපදිංචි ගොවි සංවිධානවලට, ගොවිජන සංවර්ධන සභාවලට ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලවලට සහ ගොවි සංවිධාන පළාත් බල මණ්ඩලවලට ආධාර සහ සහාය ලබා දීමේ ;

(ඇ) ඒ සංවිධානවලට සහ සභාවලට සහ බල මණ්ඩලවලට මේ පනත යටතේ වූ ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමට හැකි වන පරිදි, ඒවාට අවශ්‍ය මාර්ගෝපදේශකත්වය හා සහාය ලබා දීමේ ;

(ඈ) ජාතික කෘෂිකාර්මික කමිටුවට නියෝජිතයකු තෝරා ගැනීමේ ;

(ඉ) ආණ්ඩුවේ කෘෂිකාර්මික ප්‍රතිපත්ති පිළිබඳව ආණ්ඩුවට යෝජනා හා අදහස් ඉදිරිපත් කිරීමේ ;

(ඊ) කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවිය පිළිබඳව ගොවි සංවිධානවලට, ගොවිජන සංවර්ධන සභාවලට, ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලවලට සහ ගොවි සමාගම්වලට උපදෙස් හා සහාය ලබා දීමේ ;

(උ) කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවියෙහි ලා කුඩා ගොවි කණ්ඩායම්වලට උපදෙස් හා සහාය ලබා දීමේ හා ඒවා දිරි ගැන්වීමේ

බලය එයට ඇත්තේ ය.

ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලයේ ගිණුම් පවත්වා ගෙන යාම හා පරීක්ෂා කිරීම.

**68.** (1) ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලය විසින් පොත් හා ගිණුම් පවත්වා ගෙන යාම, කොමසාරිස් ජනරාල් විසින් සඳහන් කරනු ලබන ආකාරයට කරනු ලැබිය යුතු ය. ඒ ගිණුම් විගණනය කිරීම සඳහා කොමසාරිස් ජනරාල් විසින් විධිවිධාන සලස්වනු ලැබිය යුතු ය.

(2) ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලයේ පොත්, ලියවිලි, ලේඛන හා ගිණුම් පරීක්ෂා කිරීම, කොමසාරිස් ජනරාල් විසින් හෝ ඒ සඳහා ඔහු විසින් බලය දෙන ලද නිලධරයකු විසින් කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ විගණක කටයුතු සඳහා අවශ්‍ය සියලු පොත්, ලියවිලි, ලේඛන හා ගිණුම් ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

69. ලියාපදිංචි කළ සෑම ගොවි සංවිධානයක්ම, සෑම ගොවිජන සංවර්ධන සභාවක් ම, සෑම ගොවිජන සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලයක් ම, සෑම ගොවි සංවිධාන පළාත් බල මණ්ඩලයක් ම සහ ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලය – ගොවි සංවිධානයක්, ගොවිජන සංවර්ධන සභාවක්, ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලයක්, ගොවි සංවිධාන පළාත් බල මණ්ඩලයක්, ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලය මුද්දර ගාස්තු වලින් නිදහස් වන බව.


(අ) ඒ සංවිධානය, සභාව හෝ බල මණ්ඩලය විසින් හෝ ඒ වෙනුවෙන් හෝ එහි වාසියට හෝ ලියා අත්සන් කරනු ලබන යම් සාධන පත්‍රයක් සම්බන්ධයෙන් හෝ ඒ යම් සංවිධානයක්, සභාවක් හෝ බල මණ්ඩලයක් විසින් අධිකරණයට ඉදිරිපත් කරනු ලබන යම් ලේඛනයක් සම්බන්ධයෙන් යම් ලිඛිත නීතියක් යටතේ අය කළ යුතු මුද්දර ගාස්තුව මේ වගන්තියෙන් දෙන ලද නිදහස නොවේ නම්, ගෙවීමට ඒ සංවිධානය හෝ ඒ සභාව හෝ ඒ බල මණ්ඩලය හෝ යටත් වන අවස්ථාවක එකී සාධන පත්‍රය හෝ ලේඛනය සම්බන්ධයෙන් අය විය යුතු ගාස්තුවෙන් ; සහ


(ආ) ලේඛන ලියාපදිංචි කිරීමට අදාළ කත්, කාලයෙහි බල පවත්නා නීතිය යටතේ ගෙවිය යුතු යම් වෙනත් ගාස්තුවකින්

නිදහස් වන්නේ ය.

70. සෑම ලියාපදිංචි ගොවි සංවිධානයක් ම ද සෑම ගොවිජන සංවර්ධන සභාවක් ම ද සෑම ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩලයක් ම ද සෑම ගොවි සංවිධාන පළාත් බල මණ්ඩලයක් ම සහ ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලය විසින් ලබා ගන්නා ආදායම හෝ ලාභ වෙනුවෙන් 1979 අංක 28 දරන දේශීය ආදායම් බදු පනතේ විධිවිධාන යටතේ යම් බද්දක් ගෙවීමෙන් නිදහස් වන්නේ ය. ගොවි සංවිධාන, ගොවිජන සංවර්ධන සභා, ගොවි සංවිධාන දිස්ත්‍රික් බල මණ්ඩල, ගොවි සංවිධාන පළාත් බල මණ්ඩල සහ ශ්‍රී ලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලය දේශීය ආදායම් පනතෙන් නිදහස් බව.

# කෘෂිකර්මය




**කෘෂිකර්ම විෂයෙහි ගොවිජන සේවා උපවිෂය**

**ගොවිජන සංවර්ධනය Agrarian Development**

# ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ අභිමතාර්ථ

## විෂයය/අංශය/ අභිමතාර්ථ

## දර්ශන කෝණය (SCOPE)

**ගොවිජන නීතිය (ගොවිජන සංවර්ධන පනත)**

**සියළුම ශ්‍රී ලාංකිය ගොවීන් හා ඉඩම් හිමියන්**

01. අභිමතාර්ථ — ඉඩම් හිමියන්ගේ හා ගොවීන්ගේ වගා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

1. 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත ~~සංශෝධනය කිරීම~~.
2. කෘෂිකර්මික ඉඩම් ලේඛණ ප්‍රතිශෝධනය හා යාවත්කාලීනව පවත්වා ගෙන යාම.
3. අඳ ගොවීන් හා ඉඩම් හිමියන් අතර ඇතිවන ආරවුල් විසදීම.
4. වගා අයිතිවාසිකම් ආරක්ෂා කරදීම.
5. සුළු වාරිමාර්ග ආරක්ෂා කිරීම හා වගා රීති ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම.
6. නීති උපදේශක සේවය.
7. අධිකරණ කාර්යයන්හි නිරත වීම.
8. ගොමසාරිස් ජනරාල්වරයා නියෝජනය කරමින් පරීක්ෂණ පැවැත්වීම.

**ගොවීන්**
- ★ අඳ ගොවීන්
- ★ ඉඩම් හිමි ගොවීන්

**කෘෂිකාර්මික ඉඩම් කළමණාකාරණය** → **සියළු කෘෂිකාර්මික ඉඩම්**

02. අභිමතාර්ථ - කෘෂිකාර්මික ඉඩම් වල ප්‍රශස්ත ඵලදාවර්ධනය

1. කෘෂි ඉඩම් ඵලදායිතාවය මත පදනම් වූ දත්ත පාදමක් සැකසීම.
2. කෘෂිකාර්මික ඉඩම් කාර්යක්ෂම ලෙස භාවිතා කරවීම ( ප්‍රශස්ත පරිහරණය ).
3. කෘෂි ඉඩම් ඵලදායිතාවය සඳහා අවශ්‍ය මූලාධාර/ සේවා පහසුකම් සැපයීම.
4. ජාතික කෘෂිකාර්මික නිෂ්පාදන සැලැස්ම (ක්‍රියාත්මක සැලැස්ම ) මෙහෙයවීමට අවශ්‍ය තොරතුරු සැපයීම.

**ගොවීන් සංවිධානගත කිරීම (ආයතනික සංවර්දනය)** → **ශ්‍රී ලාංකිය ගොවි ජනතාව**

03. අභිමතාර්ථ - ශ්‍රී ලාංකිය ගොවීන් සංවිධාන ගත කිරීම

1. ශ්‍රී ලංකාවේ ගොවි ජනතාව සඳහා අවශ්‍ය ආයතනික ව්‍යුහය සැකසීමට අදාල පසුබිම ගොඩනැගීම.
2. ගොවි සංවිධාන වර්ගීකරණය කිරීම
3. ගොවීන්ගේ සංවිධාන ශක්තිය ගොඩනැගීම ( Capacity Building)
4. ගොවිජන සේවා මධ්‍යස්ථාන සංවර්ධන සහ සම්පත් එශයෙන් ප්‍රවර්ධනය කිරීම.
5. ගොවිජන සේවා බල ප්‍රදේශ යෝග්‍ය ලෙස හඳුනා ගැනීම.

**ග්‍රාම්ය වාරි ජල කළමනාකරණය** → **ග්‍රාම්ය වාරි පද්ධති**

- පෝෂක ප්‍රදේශය
- වාරි මාර්ගය
- කෙත්යාය
- ජල පාරිභෝගිකයන්

04. අභිමතාර්ථ - ග්‍රාමීය වාරි පද්ධති කළමනාකරණය තුලින් වාරිමාර්ග කාර්යක්ෂමතාවය ඉහල නැංවීම.

1. ගම්බද වාරි පද්ධති හඳුනාගැනීම හා දත්ත පසුබිම් කළමනාකරණය.
2. ගම්බද වාරි පද්ධති වල සැබෑ උරුමකරුවන් බවට ගොවි සංවිධාන පත් කිරීම.
3. ගම්බද වාරි මාර්ග කාර්යක්ෂමතාවය හා ජල ඵලදායිතා (Water Productivity ) තක්සේරුව පිළිබඳ ජාතික මට්ටමේ වැඩසටහනක් පවත්වා ගෙන යාම.
4. ගම්බද වැව් ගැඹුරු කිරීම.
5. කෘෂි මාවත් ඉදි කිරීම.
6. ගම්බද වාරි මාර්ග ඇළවේ වැඩියාව හා වැඩි දියුණු කිරීම.
7. ගම්බද වාරිමාර්ග යටතේ වගා කන්නය සැලසුම් කිරීමය සහාය වීම.
8. ක්‍රියාත්මක පර්යේෂණ තුලින් ගැලපෙන තාක්ෂණය හඳුන්වාදීම. (Appropriate Technology )

**කෘෂි යන්ත්‍රෝපකරණ** → **සියලුම ගොවීන්**

05. අභිමතාර්ථ - කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ හඳුන්වාදීම

1. කෘෂියන්ත්‍රෝපකරණ අවශ්‍යතා හඳුනාගැනීම
2. කෘෂි යන්ත්‍රෝපකරණ පවත්වා ගැනීම හා නඩත්තුව.
3. කෘෂි යන්ත්‍රෝපකරණ සැපයීම.
4. කෘෂි යන්ත්‍රෝපකරණ සඳහා දත්ත පාදමක් සැකසීම.

## මානව සම්පත් කළමණාකරණය

## සියළුම දෙපාර්තමේන්තු සේවකයින්

06. 1. අභිමතාර්ථ - ආයතනික කටයුතු කාර්යක්ෂම ලෙස හා ක්‍රමවත් ලෙස පවත්වා ගෙන යාම.

1. කාර්යමණ්ඩල බඳවා ගැනීම් හා ඵලදායී ලෙස ස්ථානගත කිරීම.
2. විනය පාලනය තහවුරු කිරීම.

2. අභිමතාර්ථ - දෙපාර්තමේන්තු සේවකයන්ගේ කාර්යසාධන පසුබිම් සංවර්ධනය

1. දෙපාර්තමේන්තු සේවකයින්ගේ කුසලතාවර්ධනය
2. සේවක සුභ සාධනය හා දිරි ගැන්වීම.
3. සේවකයින්ගේ වැඩ බෙදා ගැනීම් හා කාර්ය සාදන ඇගයීම්

3. අභිමතාර්ථ - සේවක පරිපාලන කටයුතු ක්‍රමවත්ව පවත්වා ගෙන යාම.

1. කාර්යාල කළමණාකරණය ක්‍රමවත්ව පවත්වා ගෙන යාම
2. වැටුප් තල හා වෙනත් ගෙවීම් සැකසීම.
3. සේවක සහන සැලසීමට අදාල කටයුතු

4. අභිමතාර්ථ - දෙපාර්තමේන්තු සේවකයන් සඳහා අවශ්‍ය සේවා පහසුකම් සැලසීම

1. [illegible] හා පවත්වා ගෙන යාම
2. සේවකයන් සඳහා අවශ්‍ය කාර්යාල අවශ්‍යතා හඳුනා ගැනීම හා සැලසුම් කිරීම
3. දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල සඳහා අධිශ්‍ය ප්‍රවාහන පහසුකම් සැපයීම.

## මෙහෙයුම් හා ඇගයීම්

## සියළුම කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන්

01. අභිමතාර්ථ - දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක වැඩසටහන් සැලසුම් කිරීම හා ඇගයීම.

1. දෙපාර්තමේන්තුවේ සම්පත් කළමනාකරණ සැලසුම් සැකසීමට මග පෙන්වීම.
2. දෙපාර්තමේන්තුවේ සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම හා කාර්ය සාධන හා කාර්යඵල ඇගයීම් සඳහා සහාය වීම.
3. දෙපාර්තමේන්තුවේ සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය.
4. කෘෂිකාර්මික දත්ත පාදම කළමනාකරණය.

රංජිත් රාමවික්‍රම
ගොවිජන සංවර්ධන නිලධාරී
[illegible]

## ගොවි සංවිධාන තොරතුරු

| අනු අංකය | දිස්ත්‍රික්කය | ලියාපදිංචි කර ඇති ගොවි සංවිධාන සංඛ්‍යාව | සමාජික සංඛ්‍යාව | | එකතුව | ගොවි සංවිධාන අරමුදල රුපියල් |
|---|---|---|---|---|---|---|
| | | | ස්ත්‍රී | පුරුෂ | | |
| 1 | කොළඹ | 329 | 6069 | 16658 | 22727 | 32441356.87 |
| 2 | ගම්පහ | 904 | 18816 | 39416 | 58232 | 68364005.05 |
| 3 | කළුතර | 626 | 21790 | 28791 | 50581 | 33707339.12 |
| 4 | මහනුවර | 1134 | 45758 | 55842 | 101600 | 153893022.90 |
| 5 | මාතලේ | 632 | 13671 | 36153 | 49824 | 138903994.59 |
| 6 | නුවරඑළිය | 483 | 11334 | 18832 | 30166 | 18538535.00 |
| 7 | ගාල්ල | 694 | 11989 | 24433 | 36422 | 50133726.00 |
| 8 | මාතර | 633 | 14494 | 35040 | 49534 | 65853127.85 |
| 9 | හම්බන්තොට | 716 | 20630 | 37168 | 57798 | 140771256.80 |
| 10 | අනුරාධපුරය | 1678 | 42239 | 106047 | 148286 | 869610255.00 |
| 11 | පොළොන්නරුව | 481 | 18188 | 49912 | 68100 | 179505145.00 |
| 12 | කුරුණෑගල | 2344 | 75777 | 148775 | 224552 | 269260099.88 |
| 13 | පුත්තලම | 715 | 15513 | 32170 | 47683 | 134050415.26 |
| 14 | බදුල්ල | 630 | 30585 | 54210 | 84795 | 133772384.43 |
| 15 | මොනරාගල | 628 | 25281 | 45212 | 70493 | 358136114.00 |
| 16 | රත්නපුර | 620 | 13061 | 37354 | 50415 | 81516438.65 |
| 17 | කෑගල්ල | 613 | 15273 | 25089 | 40362 | 385659342.40 |
| 18 | අම්පාර | 652 | 1289 | 3167 | 4456 | 15291630.35 |
| 19 | වව්නියාව | 246 | 7497 | 13687 | 21184 | 57640452.43 |
| 20 | මන්නාරම | 177 | 3170 | 17196 | 20366 | 27854343.76 |
| 21 | මුලතිව් | 156 | 6306 | 13627 | 19933 | 57222454.19 |
| 22 | ත්‍රිකුණාමලය | 286 | 16279 | 36590 | 52869 | 49269103.78 |
| 23 | මඩකලපුව | 228 | 1435 | 4150 | 5585 | 18331250.00 |
| 24 | කිලිනොච්චිය | 121 | 8764 | 15837 | 24601 | 46416222.32 |
| 25 | යාපනය | 267 | 8100 | 35797 | 43897 | 20101393.38 |
| | එකතුව | **15993** | **453308** | **931153** | **1384461** | **3406243409.01** |